සාර්ථකත්වය අත් විඳිමු

2022/23

වාර්ෂික වාර්තාව

කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම

සාර්ථකත්වය අත් විඳිමු

අපගේ සංදර්භය තුළ සාර්ථකත්වය සිය මූල්‍ය ඉතිහාසයේ ඉහළම ලාභය ලබා ගැනීම කෙරෙහි පූර්ණ අවධානය යොමු කරමින් අපගේ තේ නිෂ්පාදන කර්මාන්තශාලාවල සාධන සූක්ෂ්මව ඇගයීමයි. මෙම කාර්යසාධනය කාර්යක්ෂම නිෂ්පාදන ක්‍රියාවලි පමණක් නොව උපාය මාර්ගිකව වෙළඳපොළ ස්ථානීකරණය, ගුණාත්මකභාවයේ විශිෂ්ටත්වය සහ නිපුණ කළමනාකරණය පිළිබිඹු කරයි.

මෙම ජයග්‍රහණය තීව්‍ර කරනුයේ දශක තුනක අපගේ කැපවීම, වර්ධනය සහ ඔරොත්තු දීමේ හැකියාව කැටි කොට දක්වන සුවිශේෂී සන්ධිස්ථානයක් වන අප සමාගමේ 30 වැනි සංවත්සරයයි. තේ නිෂ්පාදනයේ අපගේ ගමන් මග නව්‍යකරණය, ගුණාත්මක බව වෙත කැපවීම සහ වෙනස් වන පාරිභෝගික තේරීම් කෙරෙහි ප්‍රතිචාර දැක්වීම මගින් සලකුණු කර තිබේ.

මෙම 30 වැනි සංවත්සරය සමරද්දී අපි අපගේ අතීත ජයග්‍රහණ සිහිපත් කරනවා පමණක් නොව, ගතික තේ නිෂ්පාදන ලෝකය තුළ නව ප්‍රගමන සහ අවස්ථා ග්‍රහණය කර ගනිමින් අනාගත ප්‍රයත්න සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරන්නෙමු. මෙම සංවත්සරය විශිෂ්ටත්වය කෙරෙහි අපගේ චිරස්ථායී කැපවීම පිළිබඳ තහවුරුවක් හා අපගේ සාර්ථකත්වයේ අනිවාර්ය කොටස්කරුවන් වූ අප කණ්ඩායම, රජය සහ පාරිභෝගිකයන් වෙත කෘතවේදීත්වය පළ කිරීමේ අවස්ථාවක් වේ.

මෙම වාර්ෂික වාර්තාව අපගේ වෙබ් අඩවියෙන් ද ලබා ගත හැක
www.kalubowitiyanatea.lk



දැක්ම

හොඳම ශ්‍රී ලාංකික සිටීසී හා සම්ප්‍රදායික තේ නිපදවීමේ හා අලෙවි කිරීමේ වඩාත්ම පිළිගත් ආදර්ශය බවට පත්වීම.

මෙහෙවර

දේශීය හා විදේශීය වෙළඳපොළ ඉලක්ක කර ගනිමින් ඉහළ ගුණාත්මක බවින් යුත් රසවත් හා පාරිභෝගික හිතකාමී ශ්‍රී ලාංකේය තේ නිෂ්පාදනය කිරීම.





1 පූර්විකාව

දැක්ම හා මෙහෙවර	03
විශේෂ සිදුවීම්	06
වාර්තාව පිළිබඳව	07
විශේෂ මූල්‍ය සිදුවීම්	09
අප ගැන	15
අපගේ නිෂ්පාදන	19
මෙහෙයුම් තොරතුරු	38
සම්මාන	40
සහතිකකරණ	42
පිළිගැනුම	44
සංවත්සර සැමරුම	56
ආයතනික සමාජ වගකීම් ක්‍රියාකාරකම්	58

2 කළමනාකරණ සාකච්ඡාව හා විශ්ලේෂණය

සභාපතිතුමාගේ සමාලෝචනය	10
කළමනාකාර අධ්‍යක්ෂ/ ප්‍ර.වි.නි. ගේ සමාලෝචනය	13
ආයතනික පැතිකඩ	18
අපේ ගමන් මග	23
අධ්‍යක්ෂ මණ්ඩලය	24
ආයතනික කළමනාකාර්ත්වය	28
සංවිධාන ව්‍යුහය	31
අපේ පරිණාමනය	32
අගය නිර්මාණය කිරීමේ ආකෘතිය	33
පාර්ශ්වකාර සබඳතාව	34
අවදානම් කළමනාකරණය	35
මාසික තේ නිෂ්පාදනය	45
වාර්ෂික තේ නිෂ්පාදනය	46
මාසික අමු දළු ලබා ගැනීම	48
වාර්ෂික අමු දළු ලබා ගැනීම	50
උන්නතාංශය වෙත දායකත්වය/ජාතික	51
සංසන්දනාත්මක තොරතුරු - නිෂ්පාදනය	53
උන්නතාංශය සමග විකුණුම් සාමාන්‍යය සැසඳීම	54
පුහුණුව හා සංවර්ධනය	60

3 මූල්‍ය වාර්තා

මූල්‍ය සමාලෝචනය	61
අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව	62
විගණන කමිටුව	65
ලාභ/(අලාභ) ප්‍රකාශනය	67
විස්තීරණ ආදායම් ප්‍රකාශනය	67
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය	68
ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය	70
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය	72
විගණක වාර්තාව	78
කර්මාන්තශාලා අනුව ලාභ/(අලාභ)	98
දස වසරක සාරාංශය	106

විශේෂ සිදුවීම්

රු. මිලියන 2,635.41

පිරිවැටුම රු. මිලියන 1,594.28කින් ඉහළ නැංවුණි

රු. මිලියන 220.80

බදුවලින් පසු ශුද්ධ ලාභය රු. මිලියන 228.09කින් ඉහළ යන ලදී.

රු. 47.92

කොටසක් සඳහා ඉපැයුම් රු. 49.50කින් වැඩි වුණි

කිලෝග්‍රෑමයක් සඳහා රු. 437.82

මිලදී ගත් දළු සඳහා වෙනෙක් මෙතෙක් දිවයිනේ වැඩිම මිල

වැඩිම මිල ගණන් 69

කොළඹ තේ වෙන්දේසියේදී

රු. මිලියන 19.69

මූල්‍ය ආදායම රු. මිලියන 11.21කින් වැඩි වුණි

රු. මිලියන 1,204.49

සමාගමේ සමස්ත වත්කම් පදනම රු. මිලියන 283.28කින් ඉහළ යන ලදී

ධනාත්මක ▲

සෘණාත්මක ▼

කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම පිළිබඳව

රට ප්‍රත්‍යාස්ථිතික ප්‍රතිසාධනයක් කරා මෙහෙයවීමේදී තම කාර්යභාරය ඉටු කිරීමට කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම අපේක්ෂා කරයි. අපගේ 30 වන සංවත්සර වසර තුළ 2023 මාර්තු 31න් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා අපගේ 2022/2023 වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරනුයේ ඉමහත් සතුටිනි. අපගේ පාර්ශ්වකරුන් සඳහා වටිනාකමක් නිර්මාණය කිරීම පිණිස අපගේ මෙහෙයුම් පරිසර සංදර්භය තුළ උපාය මාර්ග මෙහෙයවනු ලැබුයේ කෙසේද යන්න පිළිබඳ සාධාරණ විස්තරයක් සපයන අතරම සමාගමේ මූල්‍ය, සමාජීය, පාරිසරික සහ පාලන කාර්යසාධනය සම්බන්ධයෙන් සංක්ෂිප්ත, සාකල්‍යය සහ සමබර සමාලෝචනයක් ඉදිරිපත් කිරීමට මෙම වාර්තාව අරමුණු කරයි.

විෂය පථය සහ සීමාව

මෙම වාර්ෂික වාර්තාව කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ මෙහෙයුම් ආවරණය කරයි. සමාගම වාර්ෂික වාර්තාකරණ චක්‍රය යොදා ගන්නා අතර මෙම වාර්තාව 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා ප්‍රකාශයට පත් කරන ලද පෙර වාර්තාවේ දිගුවකි.

2007 අංක 07 දරන සමාගම් පනත, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ සහ මාර්ගෝපදේශ මගින් නියම කර ඇති පරිදි මූල්‍ය ගිණුම්කරණ පද්ධති සහ කළමනාකරණ තොරතුරු පද්ධතිවලින් ලබා ගත් මූල්‍ය සහ මූල්‍ය නොවන දෙයාකාර තොරතුරු මෙමගින් සපයා ඇත. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ ස්වාධීන මතයක් ප්‍රකාශ කරනු පිණිස ශ්‍රී ලංකා ජාතික විගණන කාර්යාලය විසින් මූල්‍ය ප්‍රකාශන විගණනය කර ඇත.

වාර්තාකරණ රාමුව

ශ්‍රී ලංකා රජයේ අවශ්‍යතා සමගින් ගෝලීයව පිළිගත් පහත දැක්වෙන වාර්තාකරණ රාමු අනුව අප කටයුතු කරන අතර මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරනු ලැබූ ආයතනික වාර්තාකරණ මාර්ගෝපදේශයන්හි යහපත් පරිචයන් සමග අප වාර්තාකරණය සම්බන්ධීකරණය කිරීමට ඇප කැපව සිටින්නෙමු.

වගුව 1

වාර්තාකරණ රාමු, ප්‍රමිති සහ මාර්ගෝපදේශ	අභ්‍යන්තර සහතිකකරණය	බාහිර සහතිකකරණය
මූල්‍ය වාර්තාකරණය		
ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති /ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති/ 2007 අංක 07 දරන සමාගම් පනත	කළමනාකාරිත්වය විසින් ස්ථාපිත කරන ලද හා විගණන කමිටුව සහ අභ්‍යන්තර විගණනය විසින් ඇගයීමට ලක් කරන ලද අභ්‍යන්තර පාලන	ජාතික විගණන කාර්යාලය
ආඛ්‍යාන වාර්තාකරණය		
රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වාර්ෂික වාර්තා සම්පාදනය කිරීමේ මාර්ගෝපදේශ	කළමනාකාරිත්වය විසින් සමාලෝචනය කරන ලදුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඇගයීමට ලක් කරන ලදී.	ජාතික විගණන කාර්යාලය
ආයතනික පාලනය		
ආයතනික පාලනය පිළිබඳ යහපත් පිළිවෙත් සංග්‍රහය	රජයට අයත් ව්‍යාපාර සඳහා ආයතනික පාලනය පිළිබඳ ශ්‍රී ලංකා මාර්ගෝපදේශ කළමනාකාරිත්වය විසින් සමාලෝචනය කරන ලදුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඇගයීමට ලක් කරන ලදී.	ජාතික විගණන කාර්යාලය

වාර්තාකරණ වැඩි දියුණු කිරීම්

තිරසර වාර්තාකරණය, අධ්‍යක්ෂ මණ්ඩල පැතිකඩ සහ අවදානම් කළමනාකරණ පිළිවෙත් ඇතුළත් කිරීම. පරිණාමන උපායමාර්ග සහ පාර්ශ්වකාර සබඳතා පිළිබඳ වැඩි අවධානය

ආයතනික වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල වගකීම

මෙම වාර්තාවේ නිරවද්‍යතාව ආරක්ෂා කිරීම පිණිස වන තම බැඳීම අධ්‍යක්ෂ මණ්ඩලය පිළිගනියි. 2022/23 වාර්තාව සමාගමේ ඒකාබද්ධ කාර්යසාධනය නිවැරදිව පෙන්නුම් කරන බවත්, අදාළ සියලු ද්‍රව්‍යමය කරුණු ආවරණය කරන බවත් අපි මෙයින් සහතික කරන්නෙමු. එසේම ශ්‍රී ලංකාවේ මහා භාණ්ඩාගාරය විසින් දෙනු ලැබූ උපදෙස් ප්‍රකාරව වාර්තාව සකස් කරනු ලැබූ බව අපි තවදුරටත් සහතික කරන්නෙමු.

පසු විපරම

ඔබගේ අදහස් හා මතවාද අප සැබවින්ම අගය කරන අතර අපගේ වාර්ෂික වාර්තාවේ ප්‍රමිතිය සහ පඨනීයතාව අඛණ්ඩව ඉහළ නැංවීමට අපි ඇප කැපව සිටින්නෙමු.

ඔබේ අදහස් පහත ලිපිනයට යොමු කරන්න.

කළමනාකාර අධ්‍යක්ෂ,
කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම,
අංක 53, රත්නායක පාර, පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකාව.

විශේෂ මූල්‍ය සිදුවීම්

වගුව 2

මාර්තු 31න් අවසන් වසර සඳහා	2022/23 (රු.)	2021/22 (රු.)
ශුද්ධ විකුණුම්	**2,635,413,672.26**	1,041,133,241
විකුණුම් පිරිවැය	**(2,285,165,802.89)**	(1,026,129,751)
දළ ලාභය	**350,247,869.37**	15,003,490
අනෙකුත් මෙහෙයුම් ආදායම	**60,406,356.64**	20,003,552
මෙහෙයුම් වියදම්වලට පෙර ලාභය/(අලාභය)	**410,654,226.01**	35,007,042
පරිපාලන වියදම්	**(72,369,962.37)**	(36,911,494)
විකුණුම්, බෙදාහැරීම් සහ අනෙකුත් වියදම්	**(1,237,181.17)**	(247,805)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලාභය/(අලාභය)	**337,047,082.47**	(2,152,257)
මූල්‍ය ආදායම	**19,694,964.91**	8,475,019
මූල්‍ය වියදම්	**(9,754,534.21)**	(9,087,534)
ශුද්ධ මූල්‍ය ආදායම	**9,940,430.70**	(612,515)
බදුකරණයට පෙර ශුද්ධ ලාභය/ (අලාභය)	**346,987,513.17**	(2,764,772)
බදුකරණය	**(126,186,737.83)**	(4,533,980)
බදුකරණයට පසු ශුද්ධ ලාභය	**220,800,775.34**	(7,298,751)
කොටසක් සඳහා ඉපැයුම්	**47.92**	(1.58)

සභාපතිතුමාගේ සමාලෝචනය



"තේ පානයේ ජීව ගුණය වන්නේ සැනසිල්ල, සහනය සහ ප්‍රසාදනයයි"

- ආතර් ග්‍රේ -

හිතවත් පාර්ශ්වකරුවනි,

2022/23 මූල්‍ය වර්ෂය සඳහා සභාපතිගේ සමාලෝචනය ප්‍රකාශ කිරීම සහ කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීම මම ඉමහත් ගෞරවයක් සේ සලකමි.

සැලකිය යුතු ආර්ථික හා සමාජීය අස්ථාවරත්වයක් සමගින් පසුගිය වසරෙහි අප සිත් අවුල් කරවනසුලු අභියෝගයන්ට මුහුණ දුන්න ද, අපගේ 30 වසරක මෙහෙයුම තුළ චේතිහාසික සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් අප සමාගම කැපී පෙනෙන මූල්‍ය කාර්යසාධනයක් සාක්ෂාත් කර ගත් බව මා පවසනුයේ හද පිරි සතුටිනි.

කර්මාන්ත සංක්ෂේපය

පසුගිය මූල්‍ය වර්ෂය පශ්චාත් වසංගත ලෝකයක හා ආර්ථික අර්බුදයක දණ වටක් එරුණු රටක දුෂ්කර හා සංකීර්ණ අවස්ථා මැදින් අපගේ ගමන හසුරුවා ගැනීමේදී එකක් පිටුපස එකක් පැමිණි අභියෝගවලින් ගහණ වූවක් විය. ඉන්ධන සහ අනෙකුත් අත්‍යවශ්‍ය ආහාර හිඟය, ඉහළ යමින් පැවති උද්ධමනය හා පොලී අනුපාත සහ බරපතළ ලෙස දුර්වල වූ රුපියල මෙම අභියෝග අතර මූලික විය. මූල්‍ය සහ ජංගම හිඟුම්වල දීර්ඝ කාලයක් පැවති හිඟ සහ හීන වෙමින් පැවති විදේශ සංචිත සමග ශ්‍රී ලංකාව දැවැන්ත ස්වෛරී ණයක ගිලී තිබුණි. ශ්‍රී ලංකාවේ ණය ශ්‍රේණිගත කිරීම් පහත හෙළීමත් එවකට පැවති සිවිල් කැලඹීමත් හේතුවෙන් අපනයන ගනුදෙනුකරුවන්ට රටේ ස්ථාවරත්වය සම්බන්ධයෙන් පැවති විශ්වාසය සහමුලින් පාහේ බිඳ වැටී තිබුණි.

2021 වසරේ සිදු කරන ලද ආනයනික රසායනික පොහොර තහනම හේතුවෙන් කෘෂිකාර්මික අංශය දැඩි පසුබෑමකට ලක් වුණි. එම ප්‍රතිපත්තිය පසුව වෙනස් කරන ලද්දේ වුව ද එමගින් ඇති කළ බලපෑම් දිගුකාලීන විය. රසායනික පොහොර තහනම, ඉන්ධන හිඟය සහ ඉහළ යමින් පැවති නිෂ්පාදන පිරිවැය හේතුවෙන් පසුගිය වසර තුළ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ 4.6%ක හැකිලීමක් ඇති විය. ශ්‍රී ලංකාවේ සමස්ත තේ නිෂ්පාදනය 16%කින් අඩු වුවද, කළුබෝවිටියාන තේ නිෂ්පාදනය 2.69%කින් වර්ධනය විය.

තේ නිෂ්පාදනය අඩුවීම කොළඹ තේ වෙන්දේසියේ තේ මිල ඉහළ යාමට හේතු විය. අඩු වූ තේ නිෂ්පාදනය නිසාවෙන් කළුබෝවිටියාන කර්මාන්තශාලා සමාගමේ තේ අපනයන ඉපැයුම් ඇමෙරිකානු ඩොලර්වලින් ගත් කල 4.9%කින් අඩු වූ නමුත් 2021 දෙසැම්බර් සිට 2022 දෙසැම්බර් දක්වා රුපියලේ අගය ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව 81.2%කින් අවප්‍රමාණය වීම හේතු කොට ගෙන රුපියල්වලින් ගත් කල අපනයන ආදායම 56%කින් වර්ධනය විය. කෙසේ වෙතත්, උද්ධමනය සහ අහස උසට නැගි පොහොර මිල හේතුවෙන් තේ නිෂ්පාදන පිරිවැය ඉහළ යාම නිසාවෙන් මෙම වර්ධනයේ බලපෑම නොගිණිය හැකි තරම් විය.

සමාගමේ කාර්යසාධනය

අභියෝගාත්මක මෙහෙයුම් පරිසරයක් මධ්‍යයේ වුවද, සමාගම රු. මිලියන 2,635.4ක පිරිවැටුමක් වාර්තා කළ අතර, එය පෙර මූල්‍ය වර්ෂය හා ගත් කල 65.3%ක වර්ධනයකි. මෙම වසරේ ද, සමාගම රු. මිලියන 220.8ක බදුවලින් පසු ශුද්ධ ලාභයක් වාර්තා කළ අතර එය 2021/2022 මූල්‍ය වර්ෂය හා සැසඳීමේදී රු. මිලියන 228.09ක වැඩි වීමකි.

එසේම කොටසක් සඳහා අපගේ ආදායම මෙම මුදල් වර්ෂයේදී රු. 49.50කින් ඉහළ ගොස් විය රු. 47.92ක් වීම අප සමාගමට උද්දාමයට කරුණකි.

ජයග්‍රහණ හා ඇගයුම්

PFI තේ කිලෝග්‍රෑමයක් සඳහා වාර්තා වූ ඉහළම මිල වූ රු. 3,250.00ක් 2022 වසරේ ජූලි මාසයේදී අත්කර ගැනීම වෙනුවෙන් කළුබෝවිටියාන තේ සමාගම ඇගයීමට ලක් විය.

පසුගිය මූල්‍ය වර්ෂය තුළ සමාගමට කටයුතු කිරීමට සිදු වූ අභියෝගාත්මක පරිසරය මධ්‍යයේ වුවද, සිය තිස් වසරක මෙහෙයුම් ඉතිහාසය තුළ බදුවලින් පසු ඉහළම ලාභය වූ රු. මිලියන 220.8ක් වාර්තා කිරීමට කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම සමත් විය.

එසේම පසුගිය මූල්‍ය වර්ෂය තුළ කොළඹ තේ වෙන්දේසියේදී ඉහළම විකුණුම් මිලවල් 69ක්ම හිමි වූයේ කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමටය.

අපගේ උපාය මාර්ගය

යහපත් නිෂ්පාදන පරිචයන්ට අනුගත වෙමින් ගුණාත්මක බවින් ඉහළ නිමි නිෂ්පාදන නිපැයුම සමාගමේ මූලික ඉලක්කයයි. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම පිණිස, සමාගම නිෂ්පාදනයේ සහ අළෙවිකරණයේ සියලු අංශවලදී ඉහළම ගුණාත්මක පරාමිතීන් පවත්වා ගනියි.

මෙම ඉලක්කය සපුරා ගැනීම තවදුරටත් පහසු කරනු වස්, අස්වැන්නේ ගුණාත්මක බව ඉහළ නැංවීමේ ක්‍රමවේදයක් ලෙස අඛණ්ඩ අධ්‍යාපනය සැපයීම මගින් කුඩා තේ වතු හිමි ප්‍රජාවේ නිපුණතා මට්ටම් ඉහළ තලයකට ගෙන වීමට සමාගම අරමුණු කරයි.

"රන්දඹු" සුබසාධක සමිති ස්ථාපිත කිරීම සමාගම සහ පාර්ශ්වකාර ප්‍රජාව සමග හොඳ හිත ශක්තිමත් වීමට හේතු කාරක වී ඇති අතර අප සැපයුම්කරුවන්ගේ ජීවිත වඩා යහපත් කරලීමේ මූලාරම්භයන්හි සමාගම නිරන්තරයෙන් යෙදී සිටියි.

"කළුබෝවිටියාන තේ" සන්නාමය යටතේ දේශීය වෙළඳපොළ තුළ දැනට සිදු කරමින් පවතින අලෙවිකරණය සාර්ථකව සිදු වන අතර එම කටයුතු තවදුරටත් ව්‍යාප්ත කිරීමට සමාගම සැලසුම් සම්පාදනය කර ඇත.

ඊට අමතරව, තම සේවක පිරිස තම ශක්තිය ලෙස කළුබෝවිටියාන තේ සමාගම හඳුනා ගන්නා අතර පුහුණු සහ සංවර්ධන වැඩසටහන් හරහා තම සේවකයන්ගේ දැනුම සහ ඵලදායීතාව ප්‍රමුඛතා ගතකිරීම අඛණ්ඩව සිදු කරයි.

අනාගත අපේක්ෂා

කර්මාන්තය පීඩාවට පත් කරන අනේකවිධ දුෂ්කරතා සැලකීමේදී, ශ්‍රී ලංකා තේ කර්මාන්තයේ පසුබෑමේ ප්‍රවණතාව මැනවින් ප්‍රත්‍යක්ෂ වේ.

අඩු රෝපණ අනුපාතිකය, අධික නිෂ්පාදන පිරිවැය, අඩු ඵලදායීතාව, වගා සඳහා යොදා ගනු ලබන බිම් ප්‍රමාණය හැකිළීම සහ උග්‍ර ශ්‍රම හිඟය වැනි ගැටලු අප්‍රිකාවේ තේ නිපදවන රටවලින් සහ ඉන්දියාවෙන් ඵල්ල වන තරගකාරිත්වයෙන් තවදුරටත් අයහපත් වී තිබේ.


විචක්ෂණ ප්‍රතිපත්ති ප්‍රතිෂ්ඨාවන් සහ සම්පාදනය මත තේ කර්මාන්තයේ අනාගතය බෙහෙවින් පරායත්ත වනු ඇත. පැහැදිලි කෙටි, මැදි හා දිගු කාලීන අරමුණු ධාරණය කර ගනිමින් ප්‍රතිපත්ති සම්පාදනය උපායමාර්ගිකව සිදු කළ යුතු වනු ඇත.

කර්මාන්තයේ පිළිගත් ප්‍රමිති පවත්වා ගනු ලබන බව සහතික කරමින් අගය එකතු කිරීම, බලශක්තිය පිරිමැසීමේ යන්ත්‍රණ, කර්මාන්තශාලා නවීකරණය තොරතුරු සන්නිවේදන තාක්ෂණය සහ නව ඩිජිටල් තාක්ෂණය භාවිතය සුදුසු පරිදි යොදා ගැනීම අවශ්‍ය වනු ඇත.

මේ සියල්ලට වඩා, නිරන්තරයෙන් වෙනස් වන පාරිභෝගික රටා සහ ක්‍රමවේදයන්ට අනුවර්තනය වීමට ප්‍රමුඛතාව ලබා දීම අත්‍යවශ්‍ය වනු ඇත. නවෝත්පාදන සහ සම්ප්‍රදායික තේ රසය ඒ අයුරින්ම පවත්වා ගැනීම අතර නිසි තුලනය සොයා ගැනීම කර්මාන්තයේ පැවැත්ම සඳහා තීරණාත්මක වනු ඇත.

ස්තුතිය

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්, සමාගමේ සාර්ථකත්වය සඳහා තීරණාත්මක වන කුඩා තේ වතු හිමි අංශයට මෙන්ම අපගේ මෙහෙයුම් සාර්ථකව අඛණ්ඩව ඉදිරියට මෙහෙයවන කළුබෝවිටියාන සමාගමේ අපගේ කාර්ය මණ්ඩලය සහ කළමනාකාරිත්වය වෙත මාගේ ප්‍රසාදය පළ කරමි. සෑම අවස්ථාවකම අප වෙත උපදෙස් මාර්ගෝපදේශ ලබා දෙමින් දැක්වූ නොමසුරු සහයෝගය වෙනුවෙන් වැවිලි කර්මාන්ත අමාත්‍ය ගරු වෛද්‍ය රමේෂ් පතිරණ මැතිතුමාට, රාජ්‍ය අමාත්‍ය ගරු ලොහාන් රත්වත්තේ මැතිතුමාට, වර්තමාන රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කැබිනට් නොවන අමාත්‍ය ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමාට, අමාත්‍යාංශ ලේකම්තුමන්ලාට සහ අමාත්‍යාංශ නිලධාරීන්ට මෙන්ම කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මාගේ ස්තුතිය පිරිනැමීමට ද මෙය අවස්ථාවක් කර ගනිමි. අපගේ තේ සඳහා නියම වටිනාකමක් නිරන්තරයෙන් ලබා දෙන සියලු තේ තැරැව්කාර සමාගම් සහ අපගේ නිෂ්පාදන මිලදී ගන්නන් ලබා දුන් සහයෝගය අපි බෙහෙවින් අගය කරන්නෙමු. අප සමඟ බැඳී සිටින සියලු පාර්ශ්වකරුවන්ගේ නිරන්තර සහයෝගය සහ පක්ෂපාතිත්වය මත අපි ඉදිරි වසරේදී ද අප වෙත එළඹිය හැකි අභියෝග වලට සාර්ථකව මුහුණ දීමට විශ්වාසයෙන් යුතුව අධිෂ්ඨානයෙන් ඉදිරියට යන්නෙමු.



බී. කේ. ඒ. යූ. රොද්‍රිගෝ,
සභාපති

කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනය



දේශීයව මෙන්ම ජාත්‍යන්තරව ද ආර්ථික අවපාතයක් පැවතියේ වුවද, 2022/23 මූල්‍ය වර්ෂය තුළ අපගේ සියලු පාර්ශ්වකරුවන් වෙත සුවිශේෂී ප්‍රතිඵල අත්කර දීමට අපට හැකි විය. පසුගිය වර්ෂයේ තේ කර්මාන්තය මෙන්ම රට ද මුහුණ පෑ අභියෝග මධ්‍යයේ අපගේ මෙහෙයුම් සාර්ථකව ඉටු කිරීමට අදාළව අප කෙරෙහි විශ්වාසය තැබූ අපගේ සියලු පාර්ශ්වකරුවන්ට මාගේ කෘතවේදීත්වය පළ කරමි.

පොහොර හිඟය හේතුවෙන් කෘෂිකාර්මික අංශය දැඩි පීඩාවකට ලක්වූ අතර තේ නිෂ්පාදන අංශය ද දැඩි බලපෑමකට ලක් විය. ජාතික ආදායම මෙන්ම ආර්ථිකයටද තර්ජනයක් වෙමින් වර්ෂය තුළ තේ නිෂ්පාදනය අඩු අස්වැන්න හේතුවෙන් 16%කින් අඩු වුණි. කෙසේ වෙතත්, කාර්යක්ෂම කළමනාකරණය හේතුවෙන් මෙම අහිතකර තත්ත්වයන් යටතේ පවා සිය නිෂ්පාදනය 2.69%කින් වර්ධනය කර ගැනීමට සමාගම සමත් විය.

කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනය

සමාගම තේ මෙට්‍රික් ටොන් 1,548ක් නිපදවා රු. මිලියන 2,635.4ක වාර්තාගත ආදායමක් ඉපැයූ අතර එමගින් 2022/23 වසර තුළ සිය ඉතිහාසයේ ඉහළම ලාභය වාර්තා කිරීමට කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමට හැකි විය. එසේම, කොළඹ තේ වෙන්දේසියේදී ඉහළම මිල ලබා ගැනීමට 'කළුබෝවිටියාන තේ' සමත් වූ අතර කුඩා තේ වතු හිමියන් විසින් සපයන ලද අමු දළු කිලෝග්‍රෑමයක් සඳහා රු. 437.82ක් වූ වැඩිම මිල ගෙවන ලදී. මෙය ඉතිහාසය තුළ කවර හෝ තේ සමාගමක් අත් කර ගත් විශිෂ්ටතම ජයග්‍රහණයකි. මෙම කැපී පෙනෙන කාර්යසාධනය මගින් ජාතික ආර්ථිකයට මෙන්ම කුඩා තේ වතු හිමියන්ගේ ආර්ථිකයට දායක වීමට හැකි වීම අපට සතුටට කරුණකි. රු. මිලියන 220.8ක ඉහළම ලාභය ද කොටසක් සඳහා වූ වැඩිම ඉපැයුම වූ රු. 47.92ක් ද සමාගම වාර්තා කරන ලදී. තවද, සැබෑ කාර්යසාධනය නිරූපණය කරමින් වසර තුළ විගණකාධිපතිවරයාගෙන් 'සත්‍ය හා සාධාරණ' මතයක් සමාගම ලබා ගන්නා ලදී.

හඳුන්වා දුන් පහත දැක්වෙන ක්‍රියාමාර්ග මෙම සුවිශේෂී කාර්යසාධනය සඳහා මූලිකවම හේතු විය.

- ලාභය උපරිම කිරීම සඳහා තරඟකාරිත්වයක් පැවැතුණ ද ප්‍රමාණවත් තරමේ අමු දළු ලබා ගැනීමට හඳුන්වා දෙනු ලැබූ උපාය මාර්ග.
- නිෂ්පාදන පිරිවැය අඩු කිරීම සහ ශුද්ධ විකුණුම් සාමාන්‍යය ඉහළ නැංවීම පිණිස කර්මාන්තශාලාවලට නවතම තාක්ෂණය හඳුන්වා දීම.
- විනිවිදභාවය සහ යහපාලනය අභිවර්ධනය පිණිස කළමනාකරණ තොරතුරු පද්ධති, ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධති සීසීටීවී කැමරා, මුහුණ හඳුනාගැනීමේ යන්ත්‍ර යොදා ගැනීම, අමු දළු බර කිරීම ස්වයංක්‍රීයකරණය, නිල ලේඛන වැඩි දියුණු කිරීම.
- පරිපාලනය ශක්තිමත් කිරීම පිණිස ක්‍රියාදාම, පද්ධති, පරිපාටි, රැකියා විස්තර, ප්‍රධාන කාර්යසාධන දර්ශක සහ කාර්යසාධන ඇගයීම නිර්දේශ කරමින් අභ්‍යන්තර චක්‍රලේඛ 303ක් නිකුත් කිරීම.
- සේවා බලකාය සඵලව කළමනාකරණය කිරීම පිණිස ඌන ක්‍රියාකාරී සේවකයන්ට එරෙහිව ගන්නා ලද උචිත ක්‍රියාමාර්ග සමගින් සේවකයන් අභිප්‍රේරණය පිණිස පුහුණු සහ ඇගයීම් වැඩසටහන් සමගින් දිරි දීමනා සහ වන්දි යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම.

අපේ බලගතුම ශක්තිය වනුයේ දැඩි කැපවීමෙන් කටයුතු කරන අපගේ සේවක මඩුල්ලයි. අභියෝග කෙතෙක් පැවතිය ද, අපගේ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමට ඔවුන් අඛණ්ඩව කැපව සිටින අතර ඒ සියලු දෙනාට මම කෘතවේදී වන්නෙමි. එසේම දැනට සිදුකරමින් පවතින පුහුණු සහ ආයතනික සමාජ වගකීම් වැඩසටහන් මගින් කුඩා තේ වතු හිමියන්ගේ සහ ප්‍රාදේශීය ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්ත්වය ඉහළ නංවා ගැනීම පිණිස ඔවුනට සහාය වීමට අපි එලෙසින්ම කැපව සිටින්නෙමු.

අපගේ දළු සපයන්නන්, ප්‍රවාහකයන් සහ පුළුල් ප්‍රජාව සඳහා 'ජීවන රටාව උසස් කිරීමේ' පාර්ශ්වකරුවකු වීමට සමාගම අරමුණු කරයි. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, භාණ්ඩාගාරය සහ අධ්‍යක්ෂ මණ්ඩලය අපගේ සියලු කාර්යයන්හිදී උපරිම සහයෝගයක් ලබා දී තිබේ.

විශාලතම සීටීසී තේ නිෂ්පාදකයා බවට පත් වෙමින් විදේශ විනිමය ඉපැයීමට සහ එමගින් අපේ ආර්ථිකය ඉදිරිය කරා රැගෙන යාමට සමාගම දායක විය. ඊට අමතරව, ආසන්න වශයෙන් කුඩා තේ වතු හිමියන් 4,000කට පමණ තම අස්වැන්න සඳහා හොඳම මිල ලැබුණි. කාබන් පා සලකුණ අඩු කරන පුනර්ජනනීය බලශක්ති ප්‍රභව ක්‍රියාත්මක කිරීම සඳහා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් සහ මූලාරම්භයන් ප්‍රවර්ධනය කිරීම මගින් තිරසර සංවර්ධනයට අනුබල දෙමින් සමාගම ආචාර ධර්මීය පරිචයන්ට දායකත්වය ලබා දෙන ලදී.

නිෂ්පාදන පිරිවැය අඩු කිරීම සහ ශුද්ධ විකුණුම් සාමාන්‍යය වැඩි කිරීම සඳහා අඛණ්ඩ සංවර්ධනය මගින් අපගේ ආයතනික අරමුණු සපුරා ගැනීම පිණිස සමාගම අපගේ සියලු ශක්තීන් ඒකරාශි කරන ලදී. කණ්ඩායමක් ලෙස කටයුතු කිරීම මගින් සහ ආදායම උපරිම කිරීම පිණිස සැලසුම් කරන ලද උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම මගින් සමාගම තේ කර්මාන්තයේ ඉහළම ස්ථානයක් කරා පිවිසෙනු ඇත. එමගින් අපගේ සියලු පාර්ශ්වකරුවන්ගේ 'ජීවිතවල ගුණාත්මකභාවය' ඉහළ නැංවෙනු ඇත. මෙම ප්‍රයත්න හරහා වඩා ඉහළ තලයකට ප්‍රවිශ්ට වීමට සමාගම අදිටන් කර ගෙන සිටී.

රාජ්‍ය ව්‍යවසායක් ලෙස අපගේ කාර්යසාධනය පසුගිය පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී ද ඇගයුමට පාත්‍ර වූ අතර අභ්‍යන්තර හා බාහිර යන පරිසර දෙකෙහිම පැවති බොහෝ අභියෝග මධ්‍යයෙහි මෙම සුවිශේෂී ජයග්‍රහණ ලබා ගැනීමට හැකි වීම පිළිබඳව අපි සැබවින්ම ආඩම්බර වන්නෙමු. අපගේ දැක්ම සාක්ෂාත් කර ගැනීම පිණිස අභ්‍යන්තරිකව හා බාහිරව සම්බන්ධ වූ සියල්ලන්ගේම කණ්ඩායම් හැඟීම සහ කැපවීම මෙම සියලු ජයග්‍රහණයන්ට හේතු වූ බවට කිසිදු සැකයක් නැත.

ඒ සඳහා දායක වූ සියලු දෙනාට ස්තුතිවන්ත වන අතර ජාතික ආර්ථිකය උග්‍ර මූල්‍ය අර්බුදයකින් පීඩා විඳිමින් තිබෙන අවස්ථාවක ව්‍යවසායේ වටිනාකම ඉහළ නංවා ගැනීමට හා රටේ දළු ජාතික ආදායම ඉහළ නංවා ගැනීමට මම ඔවුන්ගේ අඛණ්ඩ සහයෝගය පතමි.



ආචාර්ය එම්. එන්. ජයවර්ධන
කළමනාකාර අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී



අපගේ තේ කර්මාන්තශාලා දිවයිනේ පහත රට බස්නාහිර මධ්‍යම කලාපවල පිහිටා ඇති අතර ජාතික තේ නිෂ්පාදනයට 0.63%ක දායකත්වයක් ලබා දෙමින් ඉහළම ගුණාත්මක බවින් යුතු තේ කිලෝග්‍රෑම් මිලියන 1.5ක් නිපදවයි.

වර්ෂය තුළදී ඉහළම මිල ශ්‍රේණිගත කිරීම් 69ක් සාධනය කර ගනිමින් අප කර්මාන්තශාලා ඉහළම ගුණාත්මක බවින් යුත් තේ නිපදවීය. අනෙකුත් තරගකාරී තේ නිෂ්පාදන කර්මාන්තශාලා අතුරින් අනගිතම ගුණාත්මක බවින් යුතු සීටීසී තේ මිල සැලකීමේදී අපි වීම කර්මාන්තයේ ප්‍රමුඛයා වන්නෙමු. වසර 30කට වැඩි ගණනක් කොළඹ තේ වෙන්දේසියේ පහතරට උන්නතාංශ සඳහා ඉහළම ස්ථානය අපි දිගින් දිගටම හොබවා ඇත්තෙමු. අප සමාගමෙහි සේවකයන් 3,500ක් පමණ සේවය කරන අතර වඩාත්ම ආකර්ෂණීය මිල ගණන්වලට අමු දළු මිලදී ගැනීම මගින් අපි 15,000කට වැඩි පිරිසකගේ සමාජීය හා ආර්ථික ප්‍රගතිය සඳහා උපකාර කර ඇත්තෙමු.



දළු නෙළීම
එක් එක් ක්ෂේත්‍රයෙන් දින 5 සිට 8 දක්වා කාල පරාසයකින් යුතුව නිතිපතා අමු දළු නෙළා ගනු ලැබේ.



මැලවීම
එම දළු කර්මාන්තශාලාවට ලැබුණු විගස, ඒවායේ බර කිරා ද්‍රෝණිකා මත අතුරනු ලැබේ.



ඇඹරීම
මෙය කොළ ඇඹරීමේ සහ දළුවල සෛල බිත්ති පිපිරීමට සලස්වා දළුවල ඇති යුෂ මතුපිටට ගෙන ඒමේ ක්‍රියාවලියයි.





පැසවීම

තේ යුෂ පැසවීම කළු තේ නිෂ්පාදනයේ අත්‍යවශ්‍ය ක්‍රියාවලියකි.



වියළීම

පැසුණු දළුවල 45% සිට 50% දක්වා තෙතමනයක් අඩංගු වේ. වියළීමේ මූලික අරමුණ වන්නේ තෙතමනය නිස්සාරණය සහ පැසීම වැළැක්වීමයි.



වර්ග කිරීම

වියළීමෙන් පසුව, නිමි තේ වෙළඳ පොළ ඉල්ලුම පරිදි ප්‍රමාණය සහ හැඩය අනුව වර්ග කරනු ලැබේ.



කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත සහ 2007 අංක 07 දරන නව සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කරන ලද සීමා සහිත සමාගමකි. සමාගම ස්ථාපිත කරනු ලැබුයේ සී.ටී.සී. තේ නිපදවීම සඳහා වන අතර කොටසක් රු.10 බැගින් තක්සේරු කරන ලද කොටස් මිලියන පහක් ලෙස රුපියල් මිලියන 50කින් සමන්විත ආරම්භක ප්‍රාග්ධනයකින් එය 1994 අගෝස්තු 01 වන දින සිට වාණිජ මෙහෙයුම් ආරම්භ කරන ලදී. ඉන්දීය ණය ආධාර යටතේ ආරම්භක ප්‍රාග්ධනය සපයන ලදී. ඒ අන්දමින්ම ඉන්දීය ණය ආධාර යටතේ අපගේ දෙවන කර්මාන්තශාලාව වූ දෑරංගල තේ කර්මාන්තශාලාව ද ස්ථාපිත කරන ලද අතර 2000 මාර්තු මාසයේදී එහි මෙහෙයුම් ආරම්භ කරන ලදී. කලින් තේ ශක්ති අරමුදල යටතේ පැවති අපගේ තෙවන කර්මාන්තශාලාව වූ හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාව ලාභය බෙදා ගැනීමේ ගිවිසුමක් යටතේ කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමට පවරා ගන්නා ලදී. සමාගමේ අරමුදල් යොදා ගනිමින් මෙම කර්මාන්තශාලාව නවීකරණය කරනු ලැබූ අතර 2012 වසරේ සිට මෙහෙයුම් ආරම්භ කරන ලදී.

සමාගමට අවසාන වශයෙන් එකතු වූ මැණික්දිවෙල කර්මාන්තශාලාව කලින් තේ ශක්ති පදනමට හිමිව තිබූ අතර එය මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර ඡන්ද කොට්ඨාසයේ මැණික්දිවෙල ගම්මානයේ පිහිටා ඇත. මෙම කර්මාන්තශාලාව නැවත ස්ථාපිත කිරීම සඳහා ද සමාගමේ අරමුදල් භාවිත කරන ලදී.

කුඩා තේ වතු හිමියන්ගෙන් මිලදී ගත් තෝරාගත් අමු දළු යොදා ගනිමින් සමාගම ආසන්න වශයෙන් ඉතා උසස් තත්ත්වයේ තේ කිලෝග්‍රෑම් 2,000,000ක් වාර්ෂිකව නිපදවයි.

කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව කැපීම, ඉරීම සහ රැළි ගැස්වීම යන ක්‍රියාවලිය භාවිත කරමින් සී.ටී.සි. තේ වර්ග නිපදවන අතර, දෑරංගල, හිනිදුම සහ මැණික්දිවෙල කර්මාන්තශාලා සම්මත සම්ප්‍රදායික ක්‍රියාවලිය යොදා ගනිමින් පත්‍රීය සහ කුඩා ශ්‍රේණි තේ වර්ග පෙළක් නිපදවයි. සමාගමේ ISO 22000; 2018 සහතික ලත් කර්මාන්තශාලා මගින් ගෝලීය වෙළඳපොළ සඳහා උසස්ම තත්ත්වයේ නැවුම් ලංකා තේ නිපදවන අතර දිවයිනේ ප්‍රමුඛතම සීටීසී තේ නිෂ්පාදකයා ලෙස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ සුදුසුකම්වලට සැලකිය යුතු සන්නාම වටිනාකමක් එකතු කරයි. ලෝක මට්ටමේ තේ නිෂ්පාදකයෙකු වීම සඳහා වන සිය කැපවීම වෙර ගන්වමින්, යහපත් නිෂ්පාදන පරිචයන්ට අතිරේකව, කළුබෝවිටියාන සමාගම ග්ලෝබල් ගැප් රාමුව, RA/UTZ ප්‍රමිති සහ මාර්ගෝපදේශ ඇතුළුව ජාත්‍යන්තරව පිළිගත් ප්‍රශස්ත නිෂ්පාදන පරිචයන් යොදා ගෙන තිබේ.

සමාගමේ තේ නිපැයුමෙන් 90%ක් පමණ තැරැව්කරුවන් හරහා කොළඹ තේ වෙන්දේසිය වෙත යොමු කරන අතර සුළු ප්‍රමාණයක් ප්‍රධාන කාර්යාලයේ, කර්මාන්තශාලාවල සහ දීප ව්‍යාපත්ව පිහිටා ඇති අලෙවි මධ්‍යස්ථාන හරහා දේශීය වෙළඳපොළ තුළ අලෙවි කරනු ලැබේ.

සාංගමික ව්‍යවස්ථාවලිය ප්‍රකාරව සමාගමේ විධිනියෝගය පහත දැක්වෙන පරිදි වේ.

- වගාකරුවන්ගෙන් මිලදී ගත් තේ දළු පිරියම් කිරීම, පිරිසැකසුම් කිරීම සහ නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරය සිදු කිරීම
- තේ සිටුවීම, වගා කිරීම සහ තේ වතු කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම

කුඩා තේ වතු හිමියන්ගෙන් තෝරා ගත් අමු දළු මිලදී ගැනීම් යොදා ගනිමින් සමාගම වාර්ෂිකව ගුණාත්මක තේ වර්ග කිලෝග්‍රෑම් 2,000,000ක් පමණ නිපදවයි.

වෙළඳ නාම සහ තේ වර්ග

පහසුවෙන් භාවිතයට ගත හැකි කුඩා පැකට්ටුවල ඇසුරෑ තේ මගින් කාර්ය බහුල ලෝකයට සැබෑ තේ රස ලබා දීමට උපකාර වන PF1 කළුබෝවිටියාන සමාගමේ සීටීසී තේවල උසස්ම ශ්‍රේණිය වන අතර සමාගම සීටීසී නිෂ්පාදනයේ දිවයිනේ ප්‍රමුඛයා වෙයි. එම තේ මෙරට පාරිභෝගිකයන් අතර ජනප්‍රිය වෙමින් පවතී.

දෑරංගල සහ හිනිදුම තේ ඒවායේ විවිධ හැඩයෙන් යුතු තද පැහැති තේ පත්‍ර පෙනුම නිසා ප්‍රකටව ඇති අතර පැසීමට සැලැස්වූ විටදී කදිම රත් පැහැයකට පත් වන අතර එහි සුවිශේෂී රසය අනෙකුත් කලාප හයෙහිම රසයට වඩා වෙනස් වේ.

මැණික්දිවෙල ලකුණ යටතේ සම්ප්‍රදායික මැද රට තේ නිපදවන අතර එම තේ එයටම ආවේණික සුවිශේෂී රසයකින් යුක්ත වේ.

සීටීසී නිෂ්පාදන



සම්ප්‍රදායික නිෂ්පාදන




ප්‍රමිතිය


අපගේ තේ ඒවායේ විශිෂ්ට ගුණාත්මක බව නිසා කීර්තියට පත්ව ඇති අතර පිළිගත් තත්ත්ව සහතික, නිෂ්පාදන වගකීම පාරිභෝගික සෞඛ්‍යය හා ආරක්ෂාව සඳහා සහතික කරනු ලැබ තිබේ. සියලු නිපැයුම් හා ක්‍රියාදාම ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් නිකුත් කරන ලද ISO 22000:2018 සහ HACCP සමග පූර්ණව අනුකූල වන අතර ඊට අමතරව සියලු කර්මාන්ත ශාලාවලට යහපත් නිෂ්පාදන පරිචය GMP පිළිබඳ සහතිකකරණය හිමිව තිබේ. සියලු කළුබෝවිටියාන තේ නිෂ්පාදන කර්මාන්තශාලා සඳහා ආහාර සුරක්ෂිතතා කළමනාකරණ පද්ධතිය ISO 22000:2018 සහ HACCP ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම, නිෂ්පාදන වගකීම කෙරෙහි අපගේ වගකීම ශක්තිමත් කරන අතර නිෂ්පාදන ක්‍රියාවලියේ ආරම්භයේ සිට අවසානය දක්වා තත්ත්ව ප්‍රමිති පවත්වා ගනු ලබන බව සහතික කරයි. බැර ලෝහ තිබේද යන්න සොයා බැලීම සඳහා තේවල ගුණාත්මක බව වාර්ෂිකව පරීක්ෂා කරනු ලැබේ. ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක නිර්ණායක සහ කෘෂි රසායනික අවසාදිත ISO 3720 ප්‍රමිතියේ අවශ්‍යතාවන් ප්‍රකාරව වේ.


PREMIUM QUALITY
KALUBOWITIYANA
CEYLON BLACK TEA
THE FINEST BLEND OF SRI LANKAN
BP1 - Best CTC Tea
200g
PREMIUM QUALITY
DERANGALA
GINGER
CEYLON BLACK TEA
PF1
KALUBOWITIYANA TEA
OP
Black Pearl
PREMIUM HANDMADE
CEYLON TEA
Strong Tea


PREMIUM QUALITY
DERANGALA
CINNAMON
TEA
DERANGALA
PURE
CEYLON
TEA
FBOPF1
BOPF
Kalubowitiyana
Strong
Tea


1994/95
කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලාව නිෂ්පාදන මෙහෙයුම් ආරම්භ කරන ලදී
1998/99
ට්‍රාන්ස්වර්ල්ඩ් ස්ටාර් සම්මානය - ආර්ථික විද්‍යා අධ්‍යයන ආයතනය - ඉන්දියාව
2000/01
දෑරංගල තේ කර්මාන්තශාලාව මෙහෙයුම් ආරම්භ කරන ලදී.
2001/02
රු. මිලියන 4.6ක බදුවලින් පසු ලාභයක් වාර්තා කරන ලදී.
2003/04
රු. මිලියන 21.48ක බදුවලින් පසු ලාභයක් වාර්තා කරන ලදී.
2004/05
වසරේ ඉහළම විකුණුම් සාමාන්‍යය
2005/06
සිටීසී පහතරට තේ කාණ්ඩයේ ඉහළම විකුණුම් සාමාන්‍යය - ෆෝබ්ස් ඇන්ඩ් වෝකර්ස්
2006/07
සමස්ත දිවයිනේ සිටීසී පහතරට තේ කාණ්ඩයේ දිවයිනේ වැඩිම ඉහළම මිල ගණන් සංඛ්‍යාව-ෆෝබ්ස් ඇන්ඩ් වෝකර්ස්
2009/10
දෙවන ස්ථානය - වැඩිම ඉහළම මිල ගණන් සංඛ්‍යාව - ගෝල්ඩන් කප් සම්මානය
2010/11
වසරේ හොඳම ලංකා විශේෂිත වතු තේ - රුසියාව
2011/12
සීටීසී පහත රට කාණ්ඩයේ දිවයිනේ වැඩිම ඉහළම මිල සංඛ්‍යා ගණන - ෆෝබ්ස් ඇන්ඩ් වෝකර්ස්

අපේ ගමන්මග


2012/13
ගිණුම් ගිල්ප් තේ කර්මාන්ත ශාලාව මෙහෙයුම් ආරම්භ කරන ලදී.
2013/14
ජාතික වැවිලි කර්මාන්ත සම්මානය - හොඳම මහා පරිමාණ තේ කර්මාන්ත ශාලාව
2014/15
වසරේ හොඳම ලංකා විශේෂිත වතු තේ - බ්‍රෝකි (රන් හා රිදී පදක්කම් ජයග්‍රාහක)
2015/16
සමාගමට අලුතින්ම එක්වූ මැණික්දිවෙල තේ කර්මාන්ත ශාලා සමාගම්
2016/17
වසරේ හොඳම ලංකා විශේෂිත වතු තේ - චීනය
2017/18
අපගේ නව තේ ඇසුරුම් දියත් කරන ලදී.
2018/19
මෙම වසරේ ප්‍රේන්ෆොරස්ට් ඇලායන්ස් සහතිකය හිමිකර ගන්නා ලදී
2019/20
අපගේ නව වෙබ් අඩවිය හා නව තේ ඇසුරුම් දියත් කරන ලදී.
2020/21
නව ස්ථානයක විකුණුම් අලෙවිසල විවෘත කරන ලදී.
2021/22
වසරේ හොඳම ලංකා විශේෂිත වතු තේ - රුසියාව
2022/23
මිලදී ගනු ලැබූ තේ සඳහා මෙතෙක් වාර්තා වූ ඉහළම මිල වූ රු. 437.82ක් ගෙවන ලදී. ඔවුන්ගේ සඳ ඉහළම ලාභය - රු. මිලියන 220.80

අධ්‍යක්ෂ මණ්ඩලය



සභාපති
බී.කේ.ඒ.යූ. රොද්‍රිගෝ මයා



අධ්‍යක්ෂ
ජේ.ඒ.ටී.ඩී.ඒස්. කුමාර මිය



අධ්‍යක්ෂ
ඩී.එම්.එම්. දිසානායක මිය



අධ්‍යක්ෂ
එස්.වී. බණ්ඩාර හේරත් මයා



අධ්‍යක්ෂ
ආර්.සී.ඩී. ජයවර්ධන මයා



අධ්‍යක්ෂ
ජයන්ත විජේසිංහ මයා



අධ්‍යක්ෂ
දොන් උපුල් අබේසුන්දර මයා



අධ්‍යක්ෂ
ඩබ්.කේ.බී.ටී. කුමාර අල්විස් මයා

බී.කේ.ඒ.යූ. රොද්‍රිගෝ මයා

2020 මැයි 01 වන දින රොද්‍රිගෝ මහතා කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී.

ඒ මහතා රොහාන් රොද්‍රිගෝ සමූහයේ සමූහ අධ්‍යක්ෂවරයකු ලෙස කටයුතු කරයි. මෙම පත්වීමට පෙර, රොද්‍රිගෝ මහතා ශ්‍රී ලංකා තරුණ ව්‍යවසායකයන්ගේ මණ්ඩලයේ සභාපති ලෙස කටයුතු කරන ලදී. එසේම ඒ මහතා ඊට පෙරාතුව ඇ.එ.ජ. පදනම් කරගත් රාජ්‍ය නොවන සංවිධානයක මෙරට අධ්‍යක්ෂවරයා ලෙස සහ ඇ.එ.ජ. වොෂිංටන්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ දෙවන ලේකම්වරයා ලෙස ද කටයුතු කර ඇත.

රොද්‍රිගෝ මහතා ලීඩ්ස් විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී (ගෞරව) උපාධිධරයෙකි.

ජේ.ඒ.ටී.ඩී.එස්. කුමාර මිය

කුමාර මිය කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට එක් වූයේ 2022 මාර්තු 25 වන දා ය.

ඇය 2017 වසරේ සිට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරිනියක ලෙස කටයුතු කරයි. මෙම පත්වීමට පෙර ඇය කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනයේ (IHRA) කළමනාකරණ මණ්ඩල සාමාජිකාවක් විය. වත්මනෙහි ඇය ශ්‍රී ලංකා මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ සහාය අධ්‍යක්ෂවරියක ලෙස කටයුතු කරයි.

කුමාර මහත්මිය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකාවක වන අතර ඇය කොළඹ විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාරවේදී (ගණකාධිකරණය) විශේෂ ගෞරව උපාධියක් ලබා ඇත. ඇය මේ වන විට කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා ශාස්ත්‍රපති උපාධිය සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ නීති උපාධිය හදාරමින් සිටියි.

ඩී.එම්.එම්. දිසානායක මිය

දිසානායක මිය කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට එක් වූයේ 2021 මාර්තු 31 වන දා ය. ඇය 2008 වසරේ සිට ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරිනියක ලෙස කටයුතු කරයි.

ඇය කිතුල් සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවය කර ඇති අතර වත්මනෙහි දිසානායක මහත්මිය වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී ලෙස කටයුතු කරයි.

ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදී (ව්‍යාපාර පරිපාලන) විශේෂ උපාධිය ද, කැලණිය විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යා ශාස්ත්‍රපති උපාධිය සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් රාජ්‍ය ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව ද ලබා ඇත.

ඩී.යූ. අබේසුන්දර මයා

අබේසුන්දර මහතා කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරනු ලැබුයේ 2020 සැප්තැම්බර් 30 වන දා ය.

තේ කර්මාන්තයේ හා තේ වැවිලි ක්ෂේත්‍රයේ අවුරුදු 30ක අත්දැකීම් ඔහු සතු වේ. දැනට ඔහු ප්‍රාදේශීය කාර්යාලයක රාජ්‍ය සේවකයකු ලෙස සේවය කරයි.

ජේ. විජේසිංහ මයා

විජේසිංහ මහතා කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරනු ලැබුයේ 2020 සැප්තැම්බර් 30 වන දා ය.

ඔහුට රාජ්‍ය සේවයේ වසර 20කට වැඩි අත්දැකීම් ඇති අතර පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂවරයකු ලෙස කටයුතු කර ඇත. ඒ මහතා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික ද වේ.

විජේසිංහ මහතා කැලණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රවේදී උපාධිධරයෙකි.

ආර්.සී.ඩී. ජයවර්ධන මයා

ජයවර්ධන මහතා කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරනු ලැබුයේ 2021 ජනවාරි 22 වන දා ය.

නීති වෘත්තිකයෙකු ලෙස ඔහුට වසර 19කට වැඩි පළපුරුද්දක් ඇති අතර ප්‍රධාන පෙළේ බැංකු හා රක්ෂණ සමාගම් ඇතුළුව කෑගල්ල දිස්ත්‍රික්කයේ ආයතන 13ක නීතිඥවරයකු ලෙස කටයුතු කර ඇත. කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමට පත් කිරීමට පෙර ඒ මහතා සබරගමුව පළාත් මගී ප්‍රවාහන අධිකාරියේ, සමුපකාර සේවක කොමිෂන් සභාවේ සහ සංවර්ධන හා ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ අධිකාරියේ සභාපති තනතුරු දැරීය.

එස්.ඒ.බී. හේරත් මයා

හේරත් මහතා 2022 දෙසැම්බර් 02 වන දින කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරනු ලැබීය.

ඒ මහතාට විවිධ කර්මාන්තවල අත්දැකීම් ඇති අතර දක්ෂිණ සංවර්ධන අධිකාරියේ සභාපති, තරුණ සේවා සභාවේ සභාපති, නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගමේ අධ්‍යක්ෂ, හම්බන්තොට ජාත්‍යන්තර වරාය සමූහ සමාගමේ අධ්‍යක්ෂ ඇතුළුව ආයතන 9ක විවිධ තනතුරු දරා ඇත. දැනට ඔහු ජනාධිපති ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩල ප්‍රධානී කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස කටයුතු කරයි.

හේරත් මහතා ඇබර්ස්ට්විත්, වේල්ස් විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී (ආර්ථික විද්‍යා) ගෞරව උපාධිධරයෙකි.

ඩබ්ලව්. කේ.බී.ටී.කේ. අල්විස් මයා

අල්විස් මහතා කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරනු ලැබුයේ 2020 සැප්තැම්බර් 30 වන දා ය.

පළාත් පාලන ආයතන පරිපාලනය ඇතුළුව විවිධ අංශවල අවුරුදු 33කට වැඩි පළපුරුද්දක් ඔහු සතුය. ඔහු ශ්‍රී ලංකා ජර්මන් තාක්ෂණික ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ලෙස කටයුතු කර තිබේ.

අල්විස් මහතා ලංකා ජර්මානු තාක්ෂණික පුහුණු ආයතනයේ ඩිප්ලෝමාධරයෙකි.

ආයතනික කළමනාකාරිත්වය



කළමනාකාර අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී
ආචාර්ය එම්.එන්. ජයවර්ධන මයා



කළමනාකරු
(කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව)
ටී.ඒ.ඩී.ජේ.සී. තිලකරත්න මයා



කළමනාකරු
(දෑරංගල තේ කර්මාන්තශාලාව)
තුසිත සිරිවර්ධන මයා



වැඩබලන කළමනාකරු
(මූල්‍ය හා මානව සම්පත්)
ප්‍රසන්න දෙහිවලගේ මයා




කර්මාන්තශාලා කළමනාකරු
(මැණික්දිවෙල තේ කර්මාන්තශාලාව)
දමිත් මොහොට්ටිගේ මයා




සහකාර කළමනාකරු (අලෙවි)
ටී.ඩබ්.එම්.ඒ. සෝමකුමාර මයා



අභ්‍යන්තර විගණක නිලධාරී
කේ. විරන්ත අමරසේන මයා


සභාපති/අධ්‍යක්ෂ මණ්ඩලය
කළමනාකාර අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී
කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන)
කළමනාකරු (මූල්‍ය හා අලෙවි)
සහකාර කළමනාකරු (අලෙවි)
සහකාර කළමනාකරු (මූල්‍ය)
පරිපාලන නිලධාරි
අලෙවි නිලධාරී
තො.තා. සහකාර
කළමනාකරණ සහකාර
අලෙවි සහකාර
ගිණුම්/ කළමනාකරණ සහකාර
කළමනාකාර අධ්‍යක්ෂගේ පුද්ගලික සහකාර
රියැදුරු
කා.කා.ස.

සංවිධාන ව්‍යුහය


කර්මාන්තශාලා කළමනාකරු
සහකාර කර්මාන්තශාලා කළමනාකරු
අභ්‍යන්තර විගණන නිලධාරි
කර්මාන්ශාලා නිලධාරීන්
ප්‍රධාන ලිපිකරුවන්
විගණන සහකාර
රහස්‍ය ලේකම්
ව්‍යාප්ති නිලධාරි
ජ්‍යෙෂ්ඨ සහකාර කර්මාන්තශාලා නිලධාරින්
ප්‍රධාන ලිපිකරුවන්
විදුලි කාර්මික/ කාර්මික
සහකාර කර්මාන්තශාලා නිලධාරින්
සහකාර ලිපිකරුවන්
ගබඩා බාරකරු
කනිෂ්ඨ සහකාර කර්මාන්තශාලා නිලධාරින්
කනිෂ්ඨ ලිපිකරුවන්
මුරකරු
රියැදුරන්
දෛනික වැටුප්ලාභී සේවකයන්


අපගේ පරිණාමනය

සමාගම් හතරම මෙහෙයුම් කටයුතු සිදු කළ පළමු මුදල් වර්ෂයේදී කර්මාන්තශාලා තුනක්, එනම් දෑරංගල, හිනිදුම සහ මැණික්දිවෙල වාර්තා කළ මූල්‍ය අලාභය කළුබෝවිටියාන කර්මාන්තශාලාව විසින් උපයනු ලැබූ ලාභයෙන් ආවරණය කළ බැවින්, මූල්‍ය කාර්යසාධනය අතිශයින් අවදානම් විය. 2015/2016 දී කර්මාන්තශාලා තුනේ සමස්ත අලාභය රු. මිලියන 35.34ක් වූ අතර කළුබෝවිටියාන කර්මාන්තශාලාවේ ලාභය රු. මිලියන 42.46ක් විය. උපාය මාර්ගික දිශානතිය, කර්මාන්තශාලා සංවර්ධනය, වෙළඳ පොළ විවිධාංගීකරණය සහ කොටස්කරුවන්, සේවකයන්, වගාකරුවන්, සැපයුම්කරුවන් සහ රටේ තේ අංශයට අගය නිර්මාණය කිරීම මගින් තිරසර මූලාරම්භය පිළිබඳ ගනු ලැබූ වැදගත් කළමනාකරණ තීරණ හේතුවෙන් 2022/2023 මූල්‍ය වර්ෂය සුවිශේෂී සන්ධිස්ථානයක් විය.


වගුව 3

2015/2016	කළමනාකරණ මැදිහත්වීම්	2022/2023
රු. මිලියන 775.73	ආදායම ■ නිෂ්පාදනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම	**රු. මිලියන 2,635.4**
මිලියන 9.81	බදුවලින් පසු ලාභය ■ පිරිවැය හා සම්පත් කාර්යක්ෂමව කළමනාකරණය කිරීම	**රු. මිලියන 220.80**
කිලෝග්‍රෑම් මිලියන 8.62	වාර්ෂික අමු දළු ලබා ගැනීම ■ එකට බැඳුණු සැපයුම් දාමය	**මිලියන 7.4**
කිලෝග්‍රෑම් මිලියන 1.79	වාර්ෂික නිෂ්පාදනය ■ තිරසර ප්‍රතිපත්ති ■ නිෂ්පාදන ගුණාත්මක ප්‍රමිති	**කි.ග්‍රෑ. මිලියන 1.54**
රු. මිලියන 1.14	සේවක පාරිතෝෂික හා සුබසාධනය ■ පුහුණුව හා සංවර්ධනය ■ සෞඛ්‍ය රක්ෂණ ප්‍රතිපත්තිය	**රු. මිලියන 2.9**


ප්‍රස්ථාරය 1




ප්‍රස්ථාරය 2



ප්‍රස්ථාරය 3



ප්‍රස්ථාරය 4



අගය එකතු කිරීමේ ආකෘතිය

පහත දැක්වෙන රූපය සමාගමේ අගය එකතු කිරීමේ ආකෘතිය නිදර්ශනය කරන අතර වැදගත් සමාජ ආර්ථික සහ පාරිසරික බලපෑම්වලට අතිරේකව ඒකාබද්ධ වාර්තාකරණ රාමුව මඟින් අර්ථ දක්වනු ලැබූ අත්‍යවශ්‍ය ප්‍රාග්ධන යෙදවුම් පාර්ශ්වකරුවන් සඳහා නිමැවුම් හා ප්‍රතිඵල නිෂ්පාදන කිරීමට පරිවර්තනය කරන්නේ කෙසේදැයි එයින් පෙන්නුම් කරයි.

කළුබෝවිටියාන කර්මාන්තශාලා සමාගමේ අගය දාමය




පාර්ශ්වකාර සබඳතා

අප පාර්ශ්වකරුවන්ගේ ගැටලු හඳුනාගෙන ඒවාට පිළියම් යෙදීම කෙතරම් තීරණාත්මක ද යන්න පිළිබඳව කළුබෝවිටියාන සමාගම දැනුවත්ව සිටී. අපගේ තීරණ මගින් එක් එක් කණ්ඩායමට බලපෑම් ඇති වන්නේ කෙසේද හෝ බලපානු ලැබිය හැක්කේ කෙසේද යන්න මත පරායත්ත වෙමින් ප්‍රධාන පාර්ශ්වකරුවන් හඳුනාගනු ලැබ ප්‍රමුඛතා ශ්‍රේණිගත කිරීමක් ලබා දෙනු ලැබේ. රජයට අයත් ව්‍යාපාරයක් ලෙස රජය හා ප්‍රජාවන් කෙරෙහි අපගේ දැවැන්ත වගකීමක් තිබේ. සමාගමේ තෝරා ගැනීමේ ක්‍රමවේදයට පාර්ශ්වකරුවන් සම්බන්ධ කර ගන්නා අතර පහත දැක්වෙන ප්‍රමුඛතා ලැයිස්තුව ඊට අයත් වේ.

වගුව 4

පාර්ශ්වකාර කණ්ඩායම	උපායමාර්ගික සැලැස්ම	අපගේ ප්‍රතිචාරය
කොටස් හිමියන්	■ කාර්තුමය හා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ■ වාර්ෂික වාර්තාව ■ වාර්ෂික මහා සභා රැස්වීම ■ කොටසක් සඳහා ඉපැයුම් ■ වර්ධනය හා ස්ථාවරත්වය	■ වර්තමාන සංවර්ධන තත්ත්වය සමග දිගටම පවත්නා සන්නිවේදනය
සේවකයන්	■ රැකියා විස්තර, ඉලක්ක හා ප්‍රධාන කාර්යසාධන දර්ශක ■ චක්‍රලේඛ උපදෙස් හා සමාලෝචන රැස්වීම් ■ කාර්යසාධන ඇගයීම් ■ සුබසාධන කළමනාකරණය ■ වාර්ෂික පාරිතෝෂික	■ ප්‍රතිදාන සහ සංසක්ත කළමනාකරණය ■ පුහුණුව හා සංවර්ධනය ■ වෘත්තීය සංවර්ධනය
සැපයුම්කරුවන්	■ දැනුවත් කිරීමේ වැඩසටහන් ■ පොහොර සැපයීම ■ ආහාර ද්‍රව්‍ය සැපයීම ■ ණය යෝජනා ක්‍රම ■ ආකර්ෂණීය මිල ■ නියමිත වේලාවට ලබා දීම	■ නියමිත වේලාවට ගෙවීම් සිදු කිරීම ■ සැපයුම්කරුවන් රැකවරණය
වගාකරුවන්	■ ගුණාත්මක දළු 50% හෝ ඊට වැඩි ■ නියමිත වේලාවට ලබා දීම ■ තේ මණ්ඩල අවශ්‍යතාවන්ට අනුකූලව කටයුතු කිරීම ■ දළු සඳහා ආකර්ෂණීය මිල ■ සුබසාධන පහසුකම්	■ නියමිත වේලාවට ගෙවීම් සිදු කිරීම ■ අගය කිරීම හා දිරි දීමනා
ප්‍රවාහකයන්	■ තේ මණ්ඩලයේ රෙගුලාසි අනුව කටයුතු කිරීම ■ ගිවිසුමට අනුව කටයුතු කිරීම ■ සුබසාධන යෝජනා ක්‍රමය	■ නිසි වේලාවට ගෙවීම් සිදු කිරීම ■ දිරි දීමනා කළමනාකරණය
තැරැව්කරුවන්	■ තේ මණ්ඩලයේ රෙගුලාසිවලට අනුව කටයුතු කිරීම ■ මිල පාදක ප්‍රමාණය	■ අඛණ්ඩ සැපයුම ■ පිළිගැනීම

අවදානම් කළමනාකරණය



සම්පූර්ණයෙන් රජයට අයත් සමාගමක් ලෙස, සිය අරමුණ හා ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය කරා ගමන් කිරීමේදී, අවදානම් කළමනාකරණ ක්‍රියාදාමයකට කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම නිසි අවධානය යොමු කර තිබේ. අවදානම් නිරාවරණය කළමනාකරණය කිරීමේ අවසන් වගකීම දරනුයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි. අවදානම් සම්පූර්ණයෙන් තුරන් කිරීමට නොහැකි අවස්ථාවන්හිදී ඒවායේ බලපෑම අවම කිරීම පිණිස අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබන බව සහතික කිරීම පිණිස උපාය මාර්ගික හා මෙහෙයුම් යන දෙයාකාර අවදානම් කාණ්ඩ යටතේ අවදානම් කළමනාකරණය නිරතුරුව සමාලෝචනය කරනු ලැබේ. ව්‍යාපාරයේ හිමිකාරිත්වය කවරක් වුවද, අවදානමේ ස්වභාවය සහ ප්‍රමාණය කළමනාකරණය නොවැළැක්විය හැකිය. එවැනි අවදානම් සාධක ක්‍රමික හෝ අක්‍රමික විය හැකිය. ක්‍රමික අවදානම් විවිධාංගීකරණය කිරීම හෝ වැළැක්වීම කළ නොහැකිය. අනෙක් අතට, අක්‍රමික අවදානම්, ඒ ඒ ව්‍යාපාරයේ මෙහෙයුමට අනන්‍ය බැවින් නිසි අවදානම් කළමනාකරණය මගින් අවම කිරීම හෝ මඟ හැරීම කළ හැකිය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ යුතුකම් හා වගකීම්:

- හඳුනාගනු ලැබූ එක් එක් අවදානම් කාණ්ඩයේ අවදානම් අභිරුචිය සඳහා සීමාවන් ස්ථානගත කිරීම
- හඳුනාගනු ලැබූ අවදානම් ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම සහ අවශ්‍ය ක්‍රියාදාම අනුමත කිරීම

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ යුතුකම් හා වගකීම්:

- හඳුනාගත් අවදානම් සහ අවදානම් ප්‍රතිචාර උපායමාර්ග සමාලෝචනය කිරීම
- උපායමාර්ගවල ප්‍රගතිය අධීක්ෂණය කිරීම

බාහිර හා අභ්‍යන්තර විගණකවරුන්ගේ ස්වාධීන ආරක්ෂණය:

- මූල්‍ය සහ අභ්‍යන්තර පාලන නිරන්තරයෙන් සමාලෝචනය කිරීම
- පවතින අභ්‍යන්තර පාලන රාමුව ශක්තිමත් කිරීම සඳහා නිර්දේශ සැපයීම

ආයතනික කළමනාකරණ කමිටුවේ යුතුකම් හා වගකීම්:

- මෙහෙයුම් මට්ටම සමග දිගටම සිදු කරන සාකච්ඡා හරහා අවදානම පූර්ව ක්‍රියාකාරීව විශ්ලේෂණය කිරීම
- උචිත අවදානම් අවම කිරීමේ උපාය මාර්ග සම්පාදනය කර අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කිරීම
- සේවකයන් අතර අවදානම් සවිඥානකත්වය අභිවර්ධනය කිරීම හා ශක්තිමත් කිරීම
- අවදානම් ප්‍රතිපත්ති සහ පරිපාටි පිළිපැදීම ශක්තිමත් කිරීම

අවදානම් කළමනාකරණය

පහත දැක්වෙනුයේ කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ ප්‍රධාන අවදානම් හා ආශ්‍රිත අවදානම් අවම කිරීමේ ක්‍රියාකාරකම්වල විශේෂ අවස්ථාය.

වගුව 5

අවදානම	අයහපත් ප්‍රතිඵල	අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග
කොවිඩ් 19 වසංගතය ආශ්‍රිත ගැටලු	■ වසංගතය හේතුවෙන් කර්මාන්තශාලා මෙහෙයුම්වලට බාධා පැමිණීම ■ සැපයුම් දාම අවහිරතා ■ සේවකයන්ගේ ආරක්ෂාව සහ සෞඛ්‍ය කෙරෙහි අධිඅවදානම	සේවකයන් සහ සැපයුම්කරුවන් ආරක්ෂා කිරීම පිණිස අවශ්‍ය පූර්වාරක්ෂක ක්‍රියාමාර්ග ගන්නා ලදී.
මිල උච්චාවචන	■ ශුද්ධ විකුණුම් සාමාන්‍ය සහ නිෂ්පාදන පිරිවැයෙහි උච්චාවචන ලාභදායිත්වය කෙරෙහි සෘජු බලපෑමක් ඇති කරයි.	වෙළඳපොළ බුද්ධි තොරතුරු භාවිත කරමින් ක්‍රියාමාර්ග ගෙන ඇත. හැකිතාක් දුරට නිෂ්පාදන පිරිවැය පාලනය කරනු පිණිස ක්‍රියාමාර්ග ගන්නා අතරම ශුද්ධ විකුණුම් සාමාන්‍ය ඉහළ නැංවීම
වෙනස් වන පාරිභෝගික රුචි අරුචිකම්	■ හේතු ගණනාවක් නිසා, මූලිකවම පාරිභෝගිකයන්ගේ ජීවන රටාව හා රුචි අරුචිකම් මත පදනම්ව තේ සංකේන්ද්‍රිත වෙළඳපොළ වෙනස් විය හැකිය. සෞඛ්‍ය සම්බන්ධයෙන් විශේෂයෙන් සැලකිලිමත් වන පාරිභෝගිකයන්ගේ ඉහළ යාමේ ප්‍රවණතාවක් වෙළඳ පොළේ පවතින අතර ඒ නිසාවෙන් අනෙකුත් පාන වර්ග සමග ඉහළ යමින් පවතින තරගකාරිත්වයක් ඇති වී තිබේ. අවසානයේදී මෙය තරගකාරී වාසිය කෙරෙහි බලපානු ඇත.	නිශ්චිත පාරිභෝගික අවශ්‍යතා හඳුනා ගැනීම සහ අනුකූලතා ප්‍රමිති සහතික කරමින් ගුණාත්මක තේ නිෂ්පාදනය
නිෂ්පාදන ගුණාත්මකභාවය ආශ්‍රිත අවදානම		ISO සහ GMP යටතේ නිශ්චිතව දක්වා ඇති ප්‍රමිතිවලට අනුකූල වෙමින් තත්ත්ව ආරක්ෂණය අඛණ්ඩව සහතික කර තිබේ.
සේවකයන් රඳවා ගැනීම	■ මානව සම්පත් හිඟය සමාගමේ මෙහෙයුම්වලට බාධා ඇති කරනු ඇති අතර එමගින් ලාභදායීතාවට සහ ඵලදායීතාවට බලපෑම් ඇති වනු ඇත.	අපගේ සියලු සේවකයන්ගේ සුබසාධන අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු කරමින් ආකර්ෂණීය වන්දි හා දිරි දීමනා පැකේජයක් හඳුන්වා දී තිබේ.
මූල්‍ය අවදානම	■ අවශ්‍ය විටකදී පහසුවෙන් ලබාගත හැකි අරමුදල් ඇතුළුව ප්‍රමාණවත් කාරක ප්‍රාග්ධනය සමාගමට ඉතා වැදගත් වේ. සමාලෝචිත වර්ෂය තුළ පොලී අනුපාත පහළ යාමේ ප්‍රවණතාවක් තිබූ බැවින් පෙර වසරට සාපේක්ෂව මූල්‍ය පිරිවැය හා පොලී ආදායම යන දෙකම අඩු වී තිබේ.	ප්‍රශස්ත ප්‍රතිඵල ලබා ගැනීම පිණිස ආදායම සහ පිරිවැය යන දෙකම සඵලව හා කාර්යක්ෂමව කළමනාකරණය කර තිබේ.

කර්මාන්තශාලා යන්ත්‍රෝපකරණ බිඳවැටීම්	■ නිෂ්පාදන ඉලක්ක සපුරාලීම පිණිස යන්ත්‍ර හා උපකරණවල අඛණ්ඩ ක්‍රියාකාරිත්වය සහතික කිරීම ඉතා වැදගත් වේ. මෙහෙයුම්වල සිදු වන බිඳවැටීම් අවසානයේදී ලාභදායිතා ඉලක්කවලට දැඩිව බලපානු ඇත.	කලින් කලට සිදු කළ යුතු නඩත්තු සහ අලුත්වැඩියාවන් සිදු කිරීම මගින් දැනට පවතින යන්ත්‍ර නඩත්තු කරන අතර නිෂ්පාදනය වැඩි දියුණු කිරීම හා නිෂ්පාදන පිරිවැය අඩු කිරීම පිණිස අවශ්‍ය යන්ත්‍ර මිලයට ගන්නා ලදී.
බලශක්ති අර්බුදය, විදුලිය ඇණහිටීම් සහ ඉන්ධන හා දර හිඟය	■ බලශක්ති අර්බුදය හා ඉන්ධන හා දර හිඟය දිගු කාලයක් මුළුල්ලෙහි පැවැතුණහොත් කර්මාන්තශාලාවල එදිනෙදා මෙහෙයුම් කටයුතු කෙරෙහි සෘණාත්මකව බලපෑමට හැකිය.	සූක්ෂ්ම සැලසුම්කරණය මගින් මෙහෙයුම් සඳහා අවශ්‍ය කරනු ලබන දර හා ඉන්ධන අඛණ්ඩව සැපයීම සහතික කරන ලදී. අනාගතයේ බලශක්ති පිරිවැය කළමනාකරණය පිණිස ලබන වසරේ සිට මෙහෙයුම් සඳහා සූර්ය බල ශක්තිය භාවිතයට ද සැලසුම් සකස් කර තිබේ.

ආයතනික පාලනය

එය, ආයතනික පාලනය, ලෙස හඳුන්වනු ලබන පද්ධතියක් යටතේ ආයතන මෙහෙයවනු ලබන, පාලනය කරනු ලබන හා කළමනාකරණය කරනු ලබන ක්‍රමවේදයකි. ආයතනයක මෙහෙයුම් අධීක්ෂණය කිරීම පිණිස යහපත් පරිචයන් හා පරිපාටි එය සපයන අතර එහි දිගු කාලීන තිරසරභාවය සහතික කරයි. වගකීම, වගවීම, විවෘතභාවය සහ සාධාරණත්වය අතර මනා සමතුලිතතාවක් සහතික කරමින් තීරණ ගැනීමට හා සිය මෙහෙයුම් සිදු කිරීමට ආයතනයට ඇති හැකියාවට මෙම ප්‍රතිපත්ති හා පරිපාටි අත්‍යවශ්‍යයෙන් සහාය දැක්විය යුතුය.

යහ පාලන සංස්කෘතියක් ස්ථාපිත කිරීම සහ පවත්වා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ.

අධ්‍යක්ෂවරු

ව්‍යාපාර කළමනාකරණය, පරිපාලනය, තේ කර්මාන්තය සහ අලෙවිකරණය ඇතුළුව විවිධ ක්ෂේත්‍රයන්හි අත්දැකීම් බහුල වෘත්තිකයන්ගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය විධායක නොවන අධ්‍යක්ෂවරුන් 8 දෙනෙකුගෙන් සමන්විත වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය මාසයකට වරක් රැස්වන අතර සමාලෝචිත කාලසීමාව තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් දොළහක් පවත්වා ඇත.

කළමනාකරණ කමිටුව

සභාපතිවරයා කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ කළමනාකරණ කමිටුවේ ප්‍රධානත්වය දරන ලද අතර කමිටුව කළමනාකරණ අධ්‍යක්ෂ, මූල්‍ය කළමනාකරු, අලෙවි කළමනාකරු සහ අභ්‍යන්තර විගණන නිලධාරි යන අයගෙන් සමන්විත විය.

මෙහෙයුම්, මානව සම්පත්, පරිපාලනය, මූල්‍ය කටයුතු, අලෙවිකරණය, ප්‍රසම්පාදනය, විගණනය ආදිය කළමනාකරණ කමිටුව මාසිකව සමාලෝචනය කරන අතර මෙම සියලු ක්ෂේත්‍ර සඵලව කළමනාකරණය කිරීම පිණිස උචිත තීන්දු තීරණ ගනියි.

සමාගමේ දැක්ම, මෙහෙවර සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස ව්‍යුත්පන්න හා යෝග්‍ය උපාය මාර්ග කළමනාකරණ කමිටුව සැලසුම් කර ක්‍රියාවට නංවයි.

කමිටුව මාසයකට වරක් රැස්වේ.

විගණන කමිටුව

රජයට අයත් ව්‍යාපාර සඳහා වන ආයතනික පාලන මාර්ගෝපදේශ ප්‍රකාරව විගණන කමිටුව ස්ථාපිත කර ඇත. මහා භාණ්ඩාගාරය නියෝජනය කරන අධ්‍යක්ෂවරයා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කමිටුවේ සභාපතිවරයා ලෙස පත් කළ යුතුය.

සභාපතිවරයා, කළමනාකරණ අධ්‍යක්ෂ සහ මූල්‍ය කළමනාකරු ආරාධනා කරනු ලැබූ විටදී කමිටු රැස්වීම්වලට සහභාගි විය යුතුය.

සමාගමේ මෙහෙයුම් විගණන කමිටුව විසින් ස්වාධීනව පරීක්ෂා කර බලා අගයනු ලබන අතර අනුමත කරන ලද අභ්‍යන්තර විගණන සැලැස්මට අනුකූලව විගණන කර්තව්‍ය ඉටු කිරීමට බලය ලබා දෙයි.

සමාලෝචිත කාල සීමාව තුළ විගණන කමිටුවේ රැස්වීම් හතරක් කැඳවනු ලැබීය.

විගණන කමිටුවේ වාර්තාව 65 වන පිටුවේ දැක්වේ.

වගුව 6

ප්‍රධාන කාර්යාලය: කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම					
ලිපිනය: අංක 53, රත්නායක මාවත, පැලවත්ත, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.					
මානව සම්පත්	කළමනාකාර අධ්‍යක්ෂ	- 1	අභ්‍යන්තර විගණන නිලධාරී	- 1	
	කළමනාකරු/පරිපාලන හා මා.ස.	- 1	ගිණුම් සහායක	- 2	
	කළමනාකරු මූල්‍ය	- 1	කළමනාකරණ සහකාර	- 5	
	සහකාර කළමනාකරු මූල්‍ය	- 1	කාර්යාල කාර්ය සහායක	- 2	
	සහකාර කළමනාකරු අලෙවි	- 1	රියැදුරු	- 2	

වගුව 7 කළුබෝවිටියාන



කළුබෝවිටියාන සීටීසී කර්මාන්තශාලාව
අබේවිල, කළුබෝවිටියාන.

දිස්ත්‍රික්කය	මාතර
උප දිස්ත්‍රික්කය	මොරවක
ගම	කළුබෝවිටියාන
උන්නතාංශය	පහත රට
වෙළඳ ලකුණ	කළුබෝවිටියාන
නිෂ්පාදන වර්ගය	සීටීසී තේ වර්ග

මානව සම්පත්	
කර්මාන්තශාලා කළමනාකරු	- 01
කාර්යාල කාර්ය මණ්ඩලය	- 06
කර්මාන්තශාලා කාර්ය මණ්ඩලය	- 15

වගුව 8 දෑරංගල



දෑරංගල තේ කර්මාන්තශාලාව කිරිවැල්කැලේ,
පිටබැද්දර.

දිස්ත්‍රික්කය	මාතර
උප දිස්ත්‍රික්කය	මොරවක
ගම	කිරිවැල්කැලේ
උන්නතාංශය	පහත රට
වෙළඳ ලකුණ	දෑරංගල/ කිරිවැල්කැලේ
නිෂ්පාදන වර්ගය	සම්ප්‍රදායික තේ වර්ග

මානව සම්පත්	
කර්මාන්තශාලා කළමනාකරු	- 01
කාර්යාල කාර්ය මණ්ඩලය	- 04
කර්මාන්තශාලා කාර්ය මණ්ඩලය	- 10

වගුව 9 හිනිදුම හිල්ස්



හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාව
පෙස්මින්වැලි හංදිය, තවලම.

දිස්ත්‍රික්කය	ගාල්ල
උප දිස්ත්‍රික්කය	තවලම
ගම	පෙස්මින් වැලි
උන්නතාංශය	පහත රට
වෙළඳ ලකුණ	හිනිදුම හිල්ස් තවලම හිල්ස්
නිෂ්පාදන වර්ගය	සම්ප්‍රදායික තේ වර්ග

මානව සම්පත්	
කර්මාන්තශාලා කළමනාකරු	- 01
කාර්යාල කාර්ය මණ්ඩලය	- 04
කර්මාන්තශාලා කාර්ය මණ්ඩලය	- 13

වගුව 10 මැණික්දිවෙල



මැණික්දිවෙල තේ කර්මාන්තශාලාව
තිස්මඩ පාර, මැණික්දිවෙල.

දිස්ත්‍රික්කය	මහනුවර
උප දිස්ත්‍රික්කය	යටිනුවර
ගම	මැණික්දිවෙල
උන්නතාංශය	බස්නාහිර මධ්‍යම
වෙළඳ ලකුණ	මැණික්දිවෙල
නිෂ්පාදන වර්ගය	සම්ප්‍රදායික තේ වර්ග


මානව සම්පත්	
කර්මාන්තශාලා කළමනාකරු	- 01
කාර්යාල කාර්ය මණ්ඩලය	- 05
කර්මාන්තශාලා කාර්ය මණ්ඩලය	- 08










මහනුවර
කොළඹ
ගාල්ල
මාතර

2004

ට්‍රාන්ස් වර්ල්ඩ් ගෝල්ඩ් ස්ටාර් සම්මානය

ආර්ථික අධ්‍යයන ආයතනය

2005

වර්ෂය සඳහා සමස්ත ලංකා ඉහළම විකුණුම් සාමාන්‍යය

ෆෝබ්ස් ඇන්ඩ් වෝකර්

2009

වර්ෂය සඳහා සීටීසී පහතරට කාණ්ඩයේ වැඩිම ඉහළම මිල ගණන් සංඛ්‍යාව

වල්සීබීවල්

2009

ප්‍රගතියේ ඇගයූ පාර්ශ්වකරු

වල්සීබීවල්

2011

වර්ෂය සඳහා සමස්ත ලංකා වැඩිම ඉහළම මිල ගණන් සංඛ්‍යාව

ෆෝබ්ස් ඇන්ඩ් වෝකර්

2011

සීටීසී පහතරට කාණ්ඩයේ වර්ෂය සඳහා ඉහළම විකුණුම් සාමාන්‍යය

ෆෝබ්ස් ඇන්ඩ් වෝකර්

2011

වර්ෂය සඳහා කළු තේ කාණ්ඩයේ සමස්ත ලංකා ඉහළම විකුණුම් සාමාන්‍යය

ෆෝබ්ස් ඇන්ඩ් වෝකර්

2011

වර්ෂය සඳහා වැඩිම ඉහළම මිල ගණන් සංඛ්‍යාව (Off Grade)

ෆෝබ්ස් ඇන්ඩ් වෝකර්

2011

වර්ෂය සඳහා වැඩිම ඉහළම මිල ගණන් සංඛ්‍යාව (PD කාණ්ඩය)

ෆෝබ්ස් ඇන්ඩ් වෝකර්

2011

2වන කාර්තුවේ ඉහළම ශුද්ධ විකුණුම් සාමාන්‍යය වූ 434.1

ඒෂියා සියාකා

2012

වර්ෂය සඳහා සමස්ත ලංකා ඉහළම විකුණුම් සාමාන්‍යය

ෆෝබ්ස් ඇන්ඩ් වෝකර්

2012

වර්ෂය සඳහා වැඩිම ඉහළම මිල ගණන් සංඛ්‍යාව (PD කාණ්ඩය)

ෆෝබ්ස් ඇන්ඩ් වෝකර්

2014

සීටීසී පහතරට කාණ්ඩයේ වර්ෂය සඳහා ඉහළම විකුණුම් සාමාන්‍යය

ෆෝබ්ස් ඇන්ඩ් වෝකර්

2015

ඩුබායිහි පැවති තරගයේදී වසරේ හොඳම ලංකා වතු තේ සම්මානලාභී (ශ්‍රේණිය - PF1)

ශ්‍රී ලංකා තේ මණ්ඩලය

2015

ඩුබායිහි පැවති තරගයේදී වසරේ හොඳම ලංකා වතු තේ සම්මානලාභී (ශ්‍රේණිය - BP1)

ශ්‍රී ලංකා තේ මණ්ඩලය

2017

හොඳම තේ කර්මාන්ත ශාලාව කලාපීය මට්ටම

ශ්‍රී ලංකා තේ මණ්ඩලය

2017

හොඳම තේ කර්මාන්ත ශාලාව කලාපීය මට්ටම

ජාතික තේ සම්මාන උළෙල

2017

වසරේ හොඳම ලංකා විශේෂ වතු තේ - චීනයේ පැවති තරගයේ අවසන් වටයට තේරීම

ශ්‍රී ලංකා තේ මණ්ඩලය

2022

වාර්තාගත ඉහළම මිල

ජෝන් කීල්ස්





indexpo

Certificate of Conformity

This is to certify that the

Food Safety Management System

of

HINIDUMA HILLS TEA FACTORY

JASMINE VALLEY JUNCTION, THAWALAMA, GALLE

is in compliance with the
requirements of ISO 22000:2018

Scope of certification : *Activities pertaining to manufacturing of Black Tea*

Certificate no. : **FSMS 0152**

This certificate awarded on **2021-12-02** is valid until **2024-12-01**

Date of initial certification : **2021-12-02**

First Serveillance Audit	**2022-10-02**
Second Serveillance Audit	**2023-10-02**
Recertification Audit	**2024-09-02**

Ind-Expo Certification Limited
Apt. No. 20, 1st Floor, Galle Face Court 2,
Colombo 03,
Sri Lanka

Email: info@indexpo.lk
Tel: +94 11 2423452
Web: www.indexpo.lk

Director



indexpo

Certificate of Conformity

This is to certify that the

Food Safety Management System

of

DERANGALA TEA FACTORY

3RD STEP, KIRIWELKALLE, PITABEDDARA

is in compliance with the
Requirements of ISO 22000:2018

Scope of certification : Activities pertaining to manufacturing of black tea

Certification No : **FSMS 0179**
This certificate is awarded on **2022-08-29** is valid until **2025-08-28**

Date of initial certification : 2022-08-29
First surveillance Audit : 2023-06-29
Second Surveillance Audit : 2024-06-29
Recertification Audit : 2025-05-29

Director

ISO/IEC 17021 and ISO/TS 22003:2013
FMS 004-01

The certificate of compliance is valid for 3 years from the start of the current credential cycle, but it will be considered expired if the surveillance audit program stipulated in the certificate of compliance is not implemented to maintain confidence that the certified management system continues to meet requirements, unless otherwise supported by a letter of continued compliance issued by Indexpo Certification Ltd. This certificate is a property of Indexpo Certification Ltd.

Ind-Expo Certification Limited
Apt. No. 20, 1st Floor, Galle Face Court 2, Colombo 03, Sri Lanka
Email : info@indexpo.lk Tel : +94 11 2423452 Web : www.indexpo.lk

CERTIFICATE OF CONFORMITY

ISO/IEC: 17021
FMS-001-01

The Sri Lanka Standards Institution certifies that the

Food Safety Management System (FSMS) of

KALUBOWITIYANA CTC TEA FACTORY

ABEWELA, KALUBOWITIYANA, SRI LANKA

has been assessed and approved in accordance with the requirements of

SLS ISO 22000:2018 concerning the products/processes and facilities

described in the authorized schedule bearing the same certificate number

and date as appearing in this certificate

Certificate No: FSC 01244

This certificate granted on **2023-02-24** is valid up to **2024-02-23**

Date of first certification **2014-02-23**

DIRECTOR GENERAL/CEO

SRI LANKA STANDARDS INSTITUTION
No. 17, Victoria Place, Elvitigala Mawatha, Colombo 08, Sri Lanka.
www.slsi.lk

Page **1** of **2**

CERTIFICATE OF CONFORMITY

ISO 17021-1
GMP 001-02

The Sri Lanka Standards Institution
Certifies that the Good Manufacturing Practices System of

KALUBOWITIYANA CTC TEA FACTORY
ABEWELA, KALUBOWITIYANA,
SRI LANKA

has been assessed and approved in accordance with the requirements of

CXC1 -1969 (REVISED IN 2020) GENERAL PRINCIPLES OF FOOD HYGIENE
SLS 143: 2022 - CODE OF PRACTICE FOR GENERAL PRINCIPLES OF FOOD HYGIENE (THIRD REVISION)
SLS 1315 PART 2: 2007 CODE OF PRACTICE FOR TEA INDUSTRY-GOOD MANUFACTURING PRACTICES FOR PROCESSING OF BLACK TEA

Certification No **GMPSC 05253**
This certificate issued on **2023-02-24** is valid up to **2024-02-23**
Date of First Certification **2014-02-23**

SCOPE OF CERTIFICATION

MANUFACTURING CTC BLACK TEA PACKED IN MULTIWALL PAPER SACKS IN BULK

This approval is subject to the continued satisfactory operations of the organization's Good Manufacturing Practices System.

DIRECTOR GENERAL/CEO

SRI LANKA STANDARDS INSTITUTION
No. 17, Victoria Place, Elvitigala Mawatha, Colombo 08, Sri Lanka
www.slsi.lk

CERTIFICATE OF CONFORMITY

ISO/IEC: 17021
FMS-001-01

The Sri Lanka Standards Institution certifies that the

Hazard Analysis and Critical Control Points System (HACCP) of

KALUBOWITIYANA CTC TEA FACTORY

ABEWELA, KALUBOWITIYANA, SRI LANKA

has been assessed and approved in accordance with the requirements of

SLS 1266:2011 concerning the products/processes and facilities

described in the authorized schedule bearing the same certificate number

and date as appearing in this certificate

Certificate No: HSC 01924

This certificate granted on **2023-02-24** is valid up to **2024-02-23**

Date of first certification **2014-02-23**

DIRECTOR GENERAL/CEO

SRI LANKA STANDARDS INSTITUTION
No. 17, Victoria Place, Elvitigala Mawatha, Colombo 08, Sri Lanka
www.slsi.lk

Page **1** of **2**

indexpo

Certificate of Conformity

This is to certify that the
Food Safety Management System
of
MENIKDIWELA TEA FACTORY
THISMADA, MENIKDIWELA

is in compliance with the
requirements of ISO 22000:2018

Scope of certification : *Activities pertaining to manufacturing of Black Tea*

Certificate no. : **FSMS 0127**
This certificate awarded on **2021-11-29** is valid until **2024-11-28**

Date of initial certification : **2021-11-29**

First Serveillance Audit	2022-09-29
Second Serveillance Audit	2023-09-29
Recertification Audit	2024-08-29

Ind-Expo Certification Limited
Apt. No. 20, 1st Floor, Galle Face Court 2,
Colombo 03,
Sri Lanka

Email: info@indexpo.lk
Tel: +94 11 2423452
Web: www.indexpo.lk

Director

විගණකාධිපතිගෙන් කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමට දුර්ලභ ප්‍රශංසාවක්



කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ සභාපති අමින්ද රොද්‍රිගෝ මහතා, (ඉදිරි පෙළ දකුණු කෙළවර)
කළමනාකාරිත්වයේ අනෙකුත් සාමාජිකයන් සමග (ඡායාරූපය පාර්ලිමේන්තුවේ අනුග්‍රහයෙනි)

.....බෝහෝ කලකට පසු මූල්‍ය රෙගුලාසිවලට අනුකූලව කටයුතු කරන සාර්ථක රාජ්‍ය ව්‍යාපාරයක් හමු වේ.

සාපේක්ෂව කුඩා ව්‍යාපාරයක් වන කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE) විසින් 2013 තරම් ඈත කාලයේදී ඉදිරිපත් කරනු ලැබූ නිර්දේශවලට අනුව කටයුතු කර විශිෂ්ට ප්‍රතිඵල අත් කර ගෙන ඇතැයි විගණකාධිපති ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න මහතා පවසයි.

පෙර නොවූ විරූ අර්බුදවලින් ගහණ වසරක් වූ 2022 වසරේදී සමාගම රුපියල් බිලියන 2ක සැලකිය යුතු ආදායමක් සහ බදු ගෙවීමෙන් පසු රු. මිලියන 214ක ලාභයක් වාර්තා කිරීම පිළිබඳ අදහස් දක්වමින් මේ බැව් පැවසීය. එවැනි සාර්ථක රාජ්‍ය ව්‍යාපාරයක් කාරක සභාව හමුවට පැමිණියේ ඉතා දීර්ඝ කාලයකට පසුව බව වික්‍රමරත්න මහතා කීය.

සැප්තැම්බර් මස 08 වැනි දින පාර්ලිමේන්තුවේදී පැවැති කාරක සභා රැස්වීමේ මුලසුන පාර්ලිමේන්තු මන්ත්‍රී මහාචාර්ය රංජිත් බණ්ඩාර මහතා දැරීය. මාතර, ගාල්ල සහ මහනුවර දිස්ත්‍රික්කවල ඇති තම තේ කර්මාන්ශාලා දැඩි අභියෝග රැසක් මැද මෙම සාර්ථකත්වය අත් කර ගත් බව කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ සභාපති අමින්ද රොද්‍රිගෝ මහතා පැවසූ බව පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථායක සේවා අධ්‍යක්ෂ /සන්නිවේදන (වැඩ බලන) අධ්‍යක්ෂ ජනකාන්ත සිල්වා මහතා කියා සිටියේය.


ආයතනයේ ප්‍රගතිය සම්බන්ධයෙන් කාරක සභාවේ සභාපතිවරයා සමාගමට සුබ පැතීය.

මාසික තේ නිෂ්පාදනය 2022/2023


වගුව 11

මාසය	කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව (කි.ග්‍රෑ.)	දෑරංගල තේ කර්මාන්තශාලාව (කි.ග්‍රෑ.)	හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාව (කි.ග්‍රෑ.)	මැණික්දිවෙල තේ කර්මාන්තශාලාව (කි.ග්‍රෑ.)	එකතුව (කි.ග්‍රෑ.)
අප්‍රේල් 22	60,617	21,351	15,344	26,079	123,391
මැයි	78,563	20,125	13,718	25,838	138,244
ජූනි	75,737	16,682	12,116	16,004	120,539
ජූලි	89,268	16,844	8,768	6,977	121,857
අගෝස්තු	138,749	16,829	9,129	4,953	169,660
සැප්තැම්බර්	105,879	17,212	11,979	8,313	143,383
ඔක්තෝබර්	72,635	19,705	11,058	6,961	110,359
නොවැම්බර්	83,574	23,798	12,398	15,363	135,133
දෙසැම්බර්	74,833	22,516	12,697	11,388	121,434
ජනවාරි 23	81,748	21,481	13,865	16,349	133,443
පෙබරවාරි	66,450	17,302	10,727	19,598	114,077
මාර්තු	76,519	20,758	16,609	3,211	117,096
එකතුව	**1,004,572**	**234,603**	**148,406**	**161,034**	**1,548,614**


ප්‍රස්ථාරය 5




ප්‍රස්ථාරය 6



ප්‍රස්ථාරය 7



ප්‍රස්ථාරය 8




වාර්ෂික තේ නිෂ්පාදන

වගුව 12

මාසය	කළුඛෝවිටියාන තේ කර්මාන්තශාලාව (කි. ග්‍රෑ.)	දෑරංගල තේ කර්මාන්තශාලාව (කි. ග්‍රෑ.)	හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාව (කි. ග්‍රෑ.)	මැණික්දිවෙල තේ කර්මාන්තශාලාව (කි. ග්‍රෑ.)	එකතුව (කි. ග්‍රෑ.)
1994/'95	536,780	-	-	-	536,780
1995/'96	1,038,739	-	-	-	1,038,739
1996/'97	1,082,973	-	-	-	1,082,973
1997/'98	1,194,418	-	-	-	1,194,418
1998/'99	809,741	-	-	-	809,741
1999/'00	884,197	14,584	-	-	898,781
2000/'01	914,433	494,894	-	-	1,409,327
2001/'02	954,905	536,601	-	-	1,491,506
2002/'03	1,039,447	636,762	-	-	1,676,209
2003/'04	1,154,969	488,915	-	-	1,643,884
2004/'05	1,173,659	361,154	-	-	1,534,813
2005/'06	1,161,031	348,651	-	-	1,509,682
2006/'07	1,272,903	278,828	-	-	1,551,731
2007/'08	1,097,681	320,512	-	-	1,418,193
2008/'09	967,631	227,617	-	-	1,195,248
2009/'10	950,347	222,824	-	-	1,173,171
2010 /'11	994,746	269,314	-	-	1,264,060
2011 /'12	1,170,972	240,901	-	-	1,411,873
2012 /'13	1,110,907	254,706	168,425	-	1,534,038
2013 /'14	995,844	281,666	146,031	-	1,423,541
2014 /'15	943,706	315,854	171,751	-	1,431,311
2015 /'16	994,541	460,860	219,765	117,017	1,792,183
2016 /'17	811,708	429,382	253,157	209,464	1,703,711
2017 /'18	731,750	289,634	242,955	210,107	1,474,446
2018 /'19	807,843	276,186	174,272	202,120	1,460,421
2019 /'20	900,125	290,262	138,805	125,078	1,454,270
2020 /'21	916,577	314,349	320,290	163,508	1,714,724
2021 /'22	815,525	290,193	209,053	193,272	1,508,043
2022 /'23	1,004,572	234,603	148,406	161,034	1,548,614
එකතුව	**28,432,669**	**7,879,251**	**2,192,910**	**1,381,600**	**39,886,430**

වාර්ෂික තේ නිෂ්පාදන

ප්‍රස්ථාරය 9




මාසික අමු දළු ලබා ගැනීම් 2022/20


වගුව 13

මාසය	කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව		දෑරංගල තේ කර්මාන්තශාලාව	
	සැපයුම්කරුවන් සංඛ්‍යාව	සැපයූ ප්‍රමාණය (කි.ග්‍රෑ.)	සැපයුම්කරුවන් සංඛ්‍යාව	සැපයූ ප්‍රමාණය (කි.ග්‍රෑ.)
අප්‍රේල් 22	2,269	281,819	727	104,379
මැයි	2,256	378,305	721	101,686
ජූනි	2,286	353,160	713	83,345
ජූලි	2,384	427,986	700	81,748
අගෝස්තු	2,424	647,385	708	81,139
සැප්තැම්බර්	2,415	491,997	706	81,958
ඔක්තෝබර්	2,389	357,293	707	96,125
නොවැම්බර්	2,433	388,870	728	117,629
දෙසැම්බර්	2,403	345,314	700	107,214
ජනවාරි 23	2,448	380,424	691	99,165
පෙබරවාරි	2,417	317,777	685	83,555
මාර්තු	2,488	367,835	690	102,371
එකතුව		**4,738,165**		**1,140,314**

ප්‍රස්ථාරය 10




ප්‍රස්ථාරය 11




හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාව		මැණික්දිවෙල තේ කර්මාන්තශාලාව		එකතුව	
සැපයුම්කරුවන් සංඛ්‍යාව	සැපයූ ප්‍රමාණය (කි.ග්‍රෑ.)	සැපයුම්කරුවන් සංඛ්‍යාව	සැපයූ ප්‍රමාණය (කි.ග්‍රෑ.)	සැපයුම්කරුවන් සංඛ්‍යාව	සැපයූ ප්‍රමාණය (කි.ග්‍රෑ.)
103	75,724	222	120,913	3,321	582,835
97	66,300	209	122,602	3,283	668,893
87	59,715	186	75,122	3,272	571,342
91	42,703	181	32,160	3,356	584,597
92	45,364	174	24,189	3,398	798,077
88	58,382	190	40,708	3,399	673,045
80	54,215	175	32,688	3,351	540,321
84	59,411	166	71,816	3,411	637,726
81	61,735	141	53,479	3,325	567,742
82	66,918	125	71,528	3,346	618,035
84	52,825	111	86,832	3,297	540,989
90	78,585	123	14,820	3,391	563,611
	721,877		**746,857**		**7,347,213**

ප්‍රස්ථාරය 12



ප්‍රස්ථාරය 13




වාර්ෂික දළු ලබාගැනීම්

වගුව 14

වර්ෂය	කළුබෝවිටියාන	දෑරංගල	හිනිදුම හිල්ස්	මැණික්දිවෙල	එකතුව
1994/95	2,539,978	-	-	-	2,539,978
1995/96	4,758,850	-	-	-	4,758,850
1996/97	5,011,298	-	-	-	5,011,298
1997/98	5,619,161	-	-	-	5,619,161
1998/99	3,764,498	-	-	-	3,764,498
1999/00	4,092,958	68,377	-	-	4,161,335
2000/01	4,225,019	2,283,999	-	-	6,509,018
2001/02	4,406,549	2,452,187	-	-	6,858,736
2002/03	4,779,581	3,042,878	-	-	7,822,459
2003/04	5,316,428	2,274,012	-	-	7,590,440
2004/05	5,464,753	1,727,312	-	-	7,192,065
2005/06	5,362,732	1,688,298	-	-	7,051,030
2006/07	5,859,734	1,339,562	-	-	7,199,296
2007/08	5,016,084	1,559,138	-	-	6,575,222
2008/09	4,455,756	1,129,629	-	-	5,585,385
2009/10	4,406,749	1,114,004	-	-	5,520,753
2010/11	4,634,137	1,359,341	-	-	5,993,478
2011/12	5,421,437	1,136,937	-	-	6,558,374
2012/13	5,161,301	1,243,421	838,887	-	7,243,609
2013/14	4,638,578	1,386,298	731,251	-	6,756,127
2014/15	4,446,200	1,539,561	834,380	-	6,820,141
2015/16	4,774,872	2,249,785	1,095,511	542,106	8,662,274
2016/17	3,941,813	2,113,499	1,235,080	1,033,573	8,323,965
2017/18	3,499,414	1,474,475	1,224,781	1,097,625	7,296,295
2018/19	3,855,520	1,342,705	875,077	1,023,085	7,096,387
2019/20	4,237,689	1,399,915	683,988	625,482	6,947,074
2020/21	4,375,283	1,517,906	1,577,904	800,398	8,271,491
2021/22	3,864,328	1,415,917	1,065,152	901,435	7,246,832
2022/23	4,738,165	1,140,314	721,877	746,857	7,347,213
Total	**132,668,865**	**37,999,470**	**10,883,888**	**6,770,561**	**188,322,784**

ප්‍රස්ථාරය 14



පහතරට සීටීසී නිෂ්පාදනය සහ ජාතික සීටීසී නිෂ්පාදන සඳහා දායකත්වය

වගුව 15

මාසය	සීටීසී		කළුබෝවිටියාන කර්මාන්තශාලාවේ නිෂ්පාදනය කි.ග්‍රෑ. 000	නිෂ්පාදනය සඳහා දායකත්වය	
	පහතරට කි.ග්‍රෑ. 000	ජාතික කි.ග්‍රෑ. 000		පහතරට %	ජාතික %
අප්‍රේල් 22	797	1,927	60.62	7.61	3.15
මැයි	891	2,423	78.56	8.82	3.24
ජුනි	823	1,526	75.74	9.20	4.96
ජූලි	1,000	1,693	89.27	8.93	5.27
අගෝස්තු	1,122	1,812	138.75	12.37	7.66
සැප්තැම්බර්	940	1,956	105.88	11.26	5.41
ඔක්තෝබර්	810	1,727	72.64	8.97	4.21
නොවැම්බර්	949	1,833	83.57	8.81	4.56
දෙසැම්බර්	863	1,822	74.83	8.67	4.11
ජනවාරි 23	846	1,609	81.75	9.66	5.08
පෙබරවාරි	724	1,616	66.45	9.18	4.11
මාර්තු	852	1,872	76.52	8.98	4.09
එකතුව	**10,617**	**21,816**	**1,004.57**	**9.46**	**4.60**

පහතරට සම්ප්‍රදායික නිෂ්පාදනය සහ ජාතික සම්ප්‍රදායික නිෂ්පාදනය සඳහා දායකත්වය - වගුව 16

මාසය	සම්ප්‍රදායික නිෂ්පාදනය			නිෂ්පාදනය	
	පහතරට කි.ග්‍රෑම්. 000	මධ්‍යම කි.ග්‍රෑම්. 000	ජාතික කි.ග්‍රෑම්. 000	දෑරංගල තේ කර්මාන්තශාලාව කි.ග්‍රෑම්. 000	මැණික්දිවෙල තේ කර්මාන්තශාලාව කි.ග්‍රෑම්. 000
අප්‍රේල් 22	12,255	3,487	20,885	36.7	26.1
මැයි	13,953	3,814	23,467	33.8	25.8
ජූනි	12,303	2,505	18,490	28.8	16.0
ජූලි	11,876	2,491	18,047	25.6	7.0
අගෝස්තු	11,297	2,048	16,371	26.0	5.0
සැප්තැම්බර්	11,767	2,850	18,834	29.2	8.3
ඔක්තෝබර්	11,925	2,464	16,855	30.8	7.0
නොවැම්බර්	11,855	2,541	18,225	36.2	15.4
දෙසැම්බර්	11,411	2,270	17,511	35.2	11.4
ජනවාරි 23	12,222	1,911	17,366	35.3	16.3
පෙබරවාරි	10,632	2,486	16,908	28.0	19.6
මාර්තු	12,248	2,837	19,215	37.4	3.2
එකතුව	**143,744**	**31,704**	**222,174**	**383.0**	**161.0**

පහතරට සම්ප්‍රදායික නිෂ්පාදනය සහ ජාතික සම්ප්‍රදායික නිෂ්පාදනය සඳහා දායකත්වය - වගුව 17

මාසය	මුළු නිෂ්පාදනය			මුළු නිෂ්පාදනය
	පහතරට කි.ග්‍රෑම්. 000	මධ්‍යම කි.ග්‍රෑම්. 000	ජාතික කි.ග්‍රෑම්. 000	ජාතික කි.ග්‍රෑම්. 000
අප්‍රේල් 22	13,052	3,487	22,812	123.4
මැයි	14,844	3,814	25,890	138.2
ජූනි	13,126	2,505	20,016	120.5
ජූලි	12,876	2,491	19,740	121.9
අගෝස්තු	12,419	2,048	18,183	169.7
සැප්තැම්බර්	12,707	2,850	20,790	143.4
ඔක්තෝබර්	12,735	2,464	18,582	110.4
නොවැම්බර්	12,804	2,541	20,058	135.1
දෙසැම්බර්	12,274	2,270	19,333	121.4
ජනවාරි 23	13,068	1,911	18,975	133.4
පෙබරවාරි	11,356	2,486	18,524	114.1
මාර්තු	13,100	2,837	21,087	117.1
එකතුව	**154,361**	**31,704**	**243,990**	**1,548.6**

සංසන්දනාත්මක විස්තර නිෂ්පාදනය

නිෂ්පාදනය සඳහා දායකත්වය		
පහතරට %	මධ්‍යම %	ජාතික %
0.30	0.75	0.30
0.24	0.68	0.25
0.23	0.64	0.24
0.22	0.28	0.18
0.23	0.24	0.19
0.25	0.29	0.20
0.26	0.28	0.22
0.31	0.60	0.28
0.31	0.50	0.27
0.29	0.86	0.30
0.26	0.79	0.28
0.31	0.11	0.21
0.27	**0.51**	**0.24**


නිෂ්පාදනය සඳහා දායකත්වය		
පහතරට %	මධ්‍යම %	ජාතික %
0.95	0.75	0.54
0.93	0.68	0.53
0.92	0.64	0.60
0.95	0.28	0.62
1.37	0.24	0.93
1.13	0.29	0.69
0.87	0.28	0.59
1.06	0.60	0.67
0.99	0.50	0.63
1.02	0.86	0.70
1.00	0.79	0.62
0.89	0.11	0.56
1.00	**0.51**	**0.63**

විකුණුම් සාමාන්‍යය උන්නතාංශය සමඟ සැසඳීම


වගුව 18

මාසය	පහතරට සාමාන්‍යය රු.	මාසික සාමාන්‍යය					
		කළුබෝවිටියාන රු.	විචලනය	දෑරංගල	විචලනය	හිනිදුම හිල්ස් රු.	විචලනය
අප්‍රේල් 22	1,392.54	1,620.53	227.99	1,585.76	193.22	1,317.92	(74.62)
මැයි	1,372.80	1,855.13	482.33	1,607.90	235.10	1,575.37	202.57
ජූනි	1,296.24	2,025.96	729.72	1,608.11	311.87	1,545.40	249.16
ජූලි	1,498.00	2,974.15	1,476.15	1,668.84	170.84	1,659.11	161.11
අගෝස්තු	1,548.67	2,839.26	1290.59	1,641.52	92.85	1,620.92	72.25
සැප්තැම්බර්	1,666.40	1,930.46	264.06	1,837.79	171.39	1,791.93	125.53
ඔක්තෝබර්	1,539.97	1,800.47	260.50	1,675.85	135.88	1,628.33	88.36
නොවැම්බර්	1,433.75	1,664.92	231.17	1,557.59	123.84	1,575.55	141.80
දෙසැම්බර්	1,504.60	1,737.58	232.98	1,634.78	130.18	1,609.45	104.85
ජනවාරි 23	1,518.89	1,855.92	337.03	1,621.41	102.52	1,561.91	43.02
පෙබරවාරි	1,484.50	1,782.03	297.53	1,538.62	54.12	1,518.69	34.19
මාර්තු	1,288.07	1,364.49	76.42	1,038.53	249.54	1,561.91	273.84

ප්‍රස්ථාරය 15




ප්‍රස්ථාරය 16




විකුණුම් සාමාන්‍යය උන්නතාංශය සමඟ සැසඳීම

මාසය	මධ්‍යම සාමාන්‍යය රු.	මාසික සාමාන්‍යය	
		මැණික්දිවෙල රු.	විචලනය
අප්‍රේල් 22	1,148.10	1,118.86	(29.24)
මැයි	1,119.62	1,057.82	(61.80)
ජූනි	950.31	972.78	22.47
ජූලි	1,113.79	938.27	(175.52)
අගෝස්තු	1,211.51	765.19	(446.32)
සැප්තැම්බර්	1,298.39	1,126.44	(171.95)
ඔක්තෝබර්	1,272.31	1,051.31	(221.00)
නොවැම්බර්	1,161.33	1,214.86	53.53
දෙසැම්බර්	1,263.14	1,212.30	(50.84)
ජනවාරි 23	1,291.31	1,111.64	(179.67)
පෙබරවාරි	1,247.74	1,040.45	(207.29)
මාර්තු	1,113.98	929.89	(184.09)

ප්‍රස්ථාරය 17



ප්‍රස්ථාරය 18



සාංවත්සරික සැමරුම












30
KALUBOVITIYANA TEA FACTORY LTD



ආයතනික සමාජීය වගකීම් හා ක්‍රියාකාරකම්



කොවිඩ් -19 වින්නත්කරණ වැඩසටහන



පාසල් සිසුන්ට ශිෂ්‍යාධාර පිරිනැමීම



වගාකරුවන්ට ඇල්බිසියා පැළ ලබා දීම



තේ වගාකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන









මානව ප්‍රාග්ධනය ගොඩනැගීම සඳහා වන අපගේ ප්‍රයත්නයේ අත්තිවාරම වනුයේ පුහුණුව සහ සංවර්ධනයයි. සමාලෝචිත වර්ෂයේදී සේවකයන්ගේ වෘත්තීමය හා තාක්ෂණික කුසලතා අභිවර්ධනය පිණිස සමාගම සේවකයන්ට විවිධ පුහුණු අවස්ථා සපයන ලදී.

අපගේ සේවකයන්ගේ පුහුණුව සහ සංවර්ධනය සඳහා අනුගමනය කළ එක් වැදගත්ම ක්‍රමවේදයක් වනුයේ කාර්යස්ථ පුහුණුවයි. තවද, සමාගමේ බහුවිධ අංශයන්හි කටයුතු කිරීමට හැකි වන පරිදි අප කාර්ය මණ්ඩලය සවිබල ගැන්වීම පිණිස ඔවුන්ට පුහුණුව ලබා දෙන ලදී. එවැනි හැකියා වර්ධන ක්‍රියා පටිපාටි සමාගමේ නම්‍යතාව ඉහළ නංවා ඇති අතර කුසලතා උපයෝජනයෙන් සහ උපරිමායනයෙන් වාසි සලසා ගැනීමට හැකියාව ඇතිකර තිබේ. අපගේ සේවකයන්ට සමාගම හරහා සංචලතාව සඳහා අවස්ථා කිහිපයක් ලබා දී ඇති අතර වෘත්තීය සංවර්ධන ඉඩ ප්‍රස්තා සඳහා ප්‍රමුඛතාව ලබා දී තිබේ.

විධායක නිලධාරීන්/ කාර්ය මණ්ඩලය/ සේවකයන් සඳහා වසර තුළදී පුහුණු වැඩසටහන්

- කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා කාර්ය මණ්ඩල පුහුණුව (ජාතික වැවිලි කළමනාකරණ ආයතනය)
- 2023 අයවැය පිළිබඳව විධායක කාර්ය මණ්ඩලය සඳහා සම්මන්ත්‍රණය (කොළඹ කොටස් වෙළඳපොළ)

ප්‍රාග්ධන ආයෝජන

තම තරගකාරිත්වය පවත්වා ගැනීම පිණිස පද්ධති, ක්‍රියාදාම සහ යටිතල පහසුකම්වල ධාරිතා ඉහළ නැංවීම සමාගම කලින් කලට සිදුකරයි. සමාලෝචිත වර්ෂයේදී ඒ සම්බන්ධයෙන් ව්‍යාපෘති කිහිපයක් සිදු කළ අතර ඒවා පහත දැක්වේ.

- දෑරංගල තේ කර්මාන්තශාලාව සඳහා රු. මිලියන 5.4ක් වටිනා පිරියත හා යන්ත්‍රෝපකරණ ලබා ගන්නා ලදී.
- හිනිදුම තේ කර්මාන්තශාලාව සඳහා රු. මිලියන 1.9ක් වටිනා පිරියත හා යන්ත්‍රෝපකරණ ලබා ගන්නා ලදී.

සමාජීය ප්‍රාග්ධනය

කුඩා තේ වතු හිමියන්, කාර්ය මණ්ඩලය සහ සේවකයින් තම ප්‍රධානතම පාර්ශ්වකරුවන් ලෙස සමාගම සලකන අතර ඒම වටිනා පාර්ශ්වකරුවන් සමඟ සමීපව කටයුතු කරන බවට සහතික වෙයි. තම පාර්ශ්වකරුවන් සමඟ දැඩි සමීපතාවකින් කටයුතු කිරීමෙන් අදහස් වනුයේ ඔවුන් මුහුණ දෙන අභියෝග සමාගම අවබෝධ කර ගන්නා බවත්, ඒම පාර්ශ්වකරුවන්ගේ ප්‍රතිලාභය සහ ඔවුන් නගා සිටුවීම සඳහා ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘති ගණනාවක් සමාගම පවත්වා ඇති බවය.

සෞඛ්‍ය ආරක්ෂණය

සමාගමේ පාර්ශ්වකරුවන්ගේ සෞඛ්‍ය සහ යහපැවැත්ම අවධානය යොමු කරන මූලික කරුණක් වන අතර සෑම වසරකම ඔවුන්ගේ ප්‍රතිලාභය සඳහා ව්‍යාපෘති කිහිපයක් ඉටු කරනු ලැබේ.

අධ්‍යාපනික සහ අනෙකුත් ආයතනික සමාජ වගකීම් ක්‍රියාකාරකම්

- අපගේ සියලු පාර්ශ්වකරුවන්ගේ සුබසාධනය සඳහා තත්ත්ව ප්‍රමිති වැඩි දියුණු කිරීම පිණිස රන්දඹු සුබසාධක සමිතිය පිහිටුවනු ලැබීය.
- කුඩා තේ වතු හිමියන් සඳහා තේ වගාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් කර්මාන්තශාලා හතරෙහිම පවත්වනු ලැබීය.
- අප ජනතාවගේ ආගමික නැඹුරුව සිත්හි ධාරණය කර ගනිමින්, ආගම තම පාර්ශ්වකරුවන්ගේ ජීවිතවල වැදගත් භූමිකාවක් ඉටු කරන බවට සමාගම අවබෝධයෙන් සිටින බැවින්, කාර්ය මණ්ඩලය සහ සේවකයන් සඳහා බෞද්ධ භික්ෂූන් වහන්සේලාට දානය පිරිනැමීම සංවිධානය කිරීම මගින් ඒ සඳහා පහසුකම් සපයයි.

ආදායම් විශ්ලේෂණය

ඉකුත් මූල්‍ය වසරේ ඉපැයූ රු. මිලියන 1,041ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සමාගම වාර්තා කළ ආදායම රු. මිලියන 2,635ක් වූ අතර එය පෙර වසර හා සැසඳීමේදී 153%ක වර්ධනයක් පෙන්නුම් කරයි. සමාලෝචිත වර්ෂයේදී තේ මෙහෙයුම් කැපී පෙනෙන ප්‍රතිඵල වාර්තා කරන ලදී. මෙම සුවිශේෂී ප්‍රතිඵලය සඳහා දායක වූ ප්‍රධාන සාධකය වූයේ රුපියල අවප්‍රමාණය මත ලබාගත් ඉහළ විකුණුම් සාමාන්‍යයන් වේ. කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ වඩා උසස් නිෂ්පාදන ගුණාත්මක බවින් අදහස් වූයේ ලාභ සැලකිය යුතු අන්දමින් ඉහළ බව සහ එමගින් වෙන්දේසි සාමාන්‍යයට වඩා ඉහළ මිල වෙනසක් ලබා ගන්නා ලදී.

විකුණුම් පිරිවැය හා මෙහෙයුම් වියදම්

රු. මිලියන 2,285ක් වූ විකුණුම් පිරිවැය පෙර මූල්‍ය වර්ෂයට වඩා 122.90%ක වැඩිවීමක් වාර්තා කරන ලදී. මෙම වැඩිවීම සඳහා මූලිකවම හේතු වූයේ අමු දළු ලබා ගැනීම සඳහා වූ වඩා ඉහළ පිරිවැය සහ ඉහළ යමින් පැවති ඉන්ධන මිල ගණන් නිසාවෙන් ඉහළ ගිය ප්‍රවාහන වියදම්ය. විවිධ වියදම් සංරචකවල ඇතිවූ ඉහළ යාමට අනුව පෙර වසරට වඩා රු. මිලියන 36ක වර්ධනයක් පෙන්නුම් කරමින් පරිපාලන වියදම් ද 2022/23 වසරේදී රු. මිලියන 72ක් දක්වා ඉහළ යන ලදී.

වෙනත් මෙහෙයුම් ආදායම

වෙනත් මෙහෙයුම් ආදායම පෙර වසරේ වාර්තා වූ රු. මිලියන 20 සිට රු. මිලියන 60 දක්වා වැඩි විය. එහි ප්‍රතිඵලයක් ලෙස පෙර වසරේ වාර්තා වූ මෙහෙයුම් ලාභය රු. මිලියන 2.1 සිට රු. මිලියන 337 දක්වා වැඩි විය.

මූල්‍ය පිරිවැය

වර්ෂය තුළදී සමාගමේ මූල්‍ය වියදම රු. මිලියන 9.75ක් විය. ප්‍රවර්තන මූල්‍ය වර්ෂය තුළ සමාගම රු. මිලියන 19.69ක් වූ පොලී ආදායමක් උපයා ගන්නා ලදී.

මූල්‍ය තත්ත්වය හා ද්‍රවශීලතාව

ජංගම නොවන වත්කම්

ජංගම නොවන වත්කම් මුළු වත්කම්වලින් 7.75%ක් විය. සමාලෝචිත මූල්‍ය වර්ෂය තුළ, සමාගම දේපළ හා යන්ත්‍රෝපකරණ, ගොඩනැගිලි හා කර්මාන්තශාලා උපකරණ සඳහා රු. මිලියන 15.75ක් ආයෝජනය කරන ලදී.

ණය - බීසීසී ලංකා සමාගම

2004 වසරේදී බීසීසී ලංකා සමාගම වෙත ලබාදෙන ලද රු. මිලියන 10ක ණය මුදල හා ඒ සඳහා සමුච්චිත පොලිය වන රු. මිලියන 51.57 ආපසු අය කර ගැනීම සඳහා වර්ෂය තුළදී සමාගම ප්‍රයත්න කිහිපයක් දරන ලදී. කෙසේ වෙතත්, ආපසු අය කර ගැනීමේ සමාගමේ උත්සාහයන් හේතුවෙන් බීසීසී ලංකා සමාගම පියවා ඇත්තේ මුල් ණය මුදල වූ රු. මිලියන 10ක් පමණකි.

කාරක ප්‍රාග්ධනය

වර්ෂය තුළදී සමාගමේ ජංගම වත්කම් පෙර වසරේ පැවති රු. මිලියන 443 සිට රු. මිලියන 688 දක්වා ඉහළ ගියේය. තොග භාණ්ඩ රු. මිලියන 174 සිට රු. මිලියන 329 දක්වා වැඩි වුණි. මූලිකවම ශුද්ධ කෙටි කාලීන වත්කම්වල වැඩිවීමක් හේතු කොට ගෙන වෙළඳ ගෙවිය යුතු දෑ ප්‍රමාණය පෙර වසරේ පැවති රු. මිලියන 126 සිට රු. මිලියන 114 දක්වා අඩු වුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාගමට සිය ප්‍රාග්ධන චක්‍රය සතුටුදායක සීමාවන් තුළ පවත්වා ගැනීමට ඉඩ සලසමින් සමාගම අතිරික්ත මුදල් ප්‍රවාහයක් පවත්වා ගන්නා ලදී.

ප්‍රාග්ධන ව්‍යුහය

සාමාන්‍ය කොටස් ප්‍රමාණය

වර්ෂය තුළදී, ලාභය රු. මිලියන 821 දක්වා වැඩි විය. කෙසේ වෙතත් සමාලෝචිත මූල්‍ය වර්ෂය තුළදී ඉදිරියට ගෙන ආ අලාභ සංචිතවල ඉහළ යාමක් ද දක්නට හැකි විය.

.

ණය ගැනීම්

මෙම මූල්‍ය වර්ෂයේදී සමාගම කිසිදු ණය ගැනීමක් සිදු නොකරන ලදී.

කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

2023 මාර්තු 31න් අවසන් වසර සඳහා සමාගමේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමඟින් අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ වාර්ෂික වාර්තාව මේ සමග ඉදිරිපත් කරයි.

සාරාංශගත මූල්‍ය තත්ත්වය:

සාරාංශගත මූල්‍ය තත්ත්වය පහත දැක්වෙන පරිදි වේ.

වගුව 19

	2023 රු.	2022 රු.
ආදායම	**2,635,413,672.26**	1,041,133,241
විකුණුම් පිරිවැය	**(2,285,165,802.89)**	(1,026,129,751)
දළ ලාභය	**350,247,869.37**	15,003,490
වෙනත් මෙහෙයුම් ආදායම	**60,406,356.64**	20,003,552
මෙහෙයුම් වියදම්වලට පෙර ලාභය	**410,654,226.01**	35,007,042
පරිපාලන වියදම්	**(72,369,962.37)**	(36,911,494)
විකුණුම් සහ බෙදාහැරීම් වියදම්	**(1,237,181.17)**	(247,805)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලාභ	**337,047,082.47**	(2,152,257)
මූල්‍ය ආදායම්	**19,694,964.91**	8,475,019
මූල්‍ය වියදම්	**(9,754,534.21)**	(9,087,534)
ශුද්ධ මූල්‍ය ආදායම	**9,940,430.70**	(612,515)
බදුකරණයට පෙර ශුද්ධ ලාභය	**346,987,513.17**	(2,764,772)
බදුකරණය	**(126,186,737.83)**	(4,533,980)
බදුකරණයෙන් පසු ශුද්ධ ලාභය	**220,800,775.34**	(7,298,752)
කොටසක් සඳහා ඉපැයුම්	**47.92**	(1.58)

මාර්තු 31න් අවසන් වසර සඳහා වෙනත් විස්තීරණ ආදායම් පිළිබඳ ප්‍රකාශනය

වගුව 20

බදුකරණයෙන් පසු ශුද්ධ ලාභය	**220,800,775.34**	(7,298,752)
දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය	**32,052,653.94**	210,342,260
විශ්‍රාම ප්‍රතිලාභ මත ආයුගණක ලාභ/(අලාභ)	**725,235.00**	2,261,866
විලම්බිත බදු ලාභ/(අලාභ)	**(9,833,366.68)**	(316,661)
වසර සඳහා මුළු විස්තීරණ ආදායම	**243,745,297.60**	204,988,713

මූල්‍ය ප්‍රකාශන

සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිටු 71 සිට 76 තෙක් දක්වා ඇත.

විගණකවරුන්ගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලයේ විගණන වාර්තාව පිටු 67 සිට 70 තෙක් දක්වා ඇත.

ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී යොදා ගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු 77 සිට 81 තෙක් දක්වා ඇත. එසේ යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල ප්‍රමාණාත්මක වෙනස්කම් නොමැත.

අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය සහ අනෙකුත් ප්‍රතිලාභ

2023 මාර්තු 31න් අවසන් මූල්‍ය වසර සඳහා අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්හි විස්තර කොට ඇත.

මූල්‍ය වර්ෂයෙන් පසුව ඉල්ලා අස්වීම් ලබා දුන් අධ්‍යක්ෂවරු

ජේ.ඒ.ටී.ඩී.එස්. කුමාර මිය 2023 අගෝස්තු 07 වන දින ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස්විය.

මූල්‍ය වර්ෂයෙන් පසුව පත් කරන ලද අධ්‍යක්ෂවරු

බී.ඒ.ටී. රොද්‍රිගෝ මහතා 2023 අගෝස්තු 07 වැනි දින අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කරන ලදී.

විගණන කමිටු සාමාජිකයන්

- ජේ.ඒ.ටී.ඩී.එස්. කුමාර මිය - සභාපතිනිය (2023.08.07 වැනි දින ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස්විය)
- ජේ. විජේසිංහ මයා
- ඩී.එම්.එම්. දිසානායක මිය
- බී.ඒ.ටී. රොද්‍රිගෝ මයා (2023.08.07 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්කරන ලදී.)

වත්මන් අධ්‍යක්ෂවරු

- බී.කේ.ඒ.යූ. රොද්‍රිගෝ මහතා - සභාපති
- බී.ඒ.ටී. රොද්‍රිගෝ මහතා
- එස්.ඒ.බී. හේරත් මහතා
- ඩබ්ලිව්.ඒ.කේ.බී.ටී.කේ. අල්විස් මහතා
- ඩී.යූ. අබේසුන්දර මහතා
- ජේ. විජේසිංහ මහතා
- ආර්.සී. දිනේෂ් මහතා
- ඩී.එම්.එම්. දිසානායක මිය

විගණකවරු

සමාලෝචිත වර්ෂය සඳහා ගිණුම් විගණකාධිපතිවරයා විසින් විගණනය කරන ලද අතර ඔහු නැවත විගණක ලෙස පත්කර ඇත. 2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව ඔවුන් නැවත පත්කිරීම හා ඔවුන්ගේ පාරිශ්‍රමිකය තීරණය කිරීමට අධ්‍යක්ෂවරුන්ට බලය පවරන යෝජනාවක් එළඹෙන වාර්ෂික මහා සභා රැස්වීමේදී යෝජනා ගෙන එනු ඇත.

සමාගම විසින් විගණන ගාස්තු ලෙස රු. 700,000ක් ගෙවන ලදී.

අධ්‍යක්ෂවරුන් දන්නා තරමට ඉහත විස්තර කර ඇති ඒවා හැරණු විට විගණකවරුන්ට සමාගම සමග කිසිදු සබඳතාවක් (විගණකවරයකු ලෙස හැර) නොමැත. විගණකවරුන්ට සමාගම සමග කිසිදු බැඳියාවක් නොමැත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

P. R. SECRETARIAL SERVICES (PRIVATE) LIMITED
(PV 2631)

Company Secretary / ~~Director~~ / Authorised Signatory
Company Secretary Reg. No. SEC/(2)/96-25

.....	.....	.....
අධ්‍යක්ෂ	අධ්‍යක්ෂ	ලේකම්

2023 නොවැම්බර් 27 දින කොළඹදීය.

විගණන කමිටු වාර්තාව

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් රජයට අයත් ව්‍යාපාර සඳහා වන ආයතනික පාලන මාර්ගෝපදේශ ප්‍රකාරව විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වන අතර මහා භාණ්ඩාගාරයේ නියෝජිතයා විසින් එහි සභාපතිත්වය දරයි.

එම මාර්ගෝපදේශ අනුව, අදාළ සියලු නීති, රෙගුලාසි සහ රජයේ චක්‍රලේඛ සමග අනුකූලතාව අඛණ්ඩව සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය කිරීම මගින් මූල්‍ය වාර්තාකරණය අදාළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ අනෙකුත් අදාළ නෛතික අවශ්‍යතාවන් සමග අනුකූල වන බව සහතික කිරීමේදී විගණන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය විය යුතුය. එසේම, අධ්‍යක්ෂ මණ්ඩලයට ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග ගැනීමට හැකිවන පරිදි අභ්‍යන්තර පාලන පද්ධති සහ අභ්‍යන්තර හා බාහිර විගණන වාර්තා සහ කෝප් කමිටුවේ නිර්දේශ සමාලෝචනය කිරීම මගින් අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම ද විගණන කමිටුවේ වගකීම වන්නේය.

කමිටු රැස්වීම්

සමාලෝචිත වර්ෂයේදී සියලු සාමාජිකයන්ගේ සහභාගිත්වයෙන් කමිටුව සිව් වරක් කැඳවනු ලැබූ අතර වත්කම් ආරක්ෂා කිරීම සඳහා පිළිගත හැකි මට්ටමක සහතිකයක් සැපයීමේදී අභ්‍යන්තර පාලන පද්ධතියේ කාර්යක්ෂමතාව ඇගයීම සඳහා පවතින පරිපාටි පරීක්ෂා කර බලන ලදී.

වගුව 21

කමිටු සාමාජිකයාගේ නම	06/06/2022	05/10/2022	30/01/2023	23/03/2023
ජේ.ඒ.ටී.ඩී.වස්. කුමාර මිය	√	√	√	√
ඩී.වම්.වම්. දිසානායක මිය	√	√	√	√
ඉන්ද්‍රාණි සුගතදාස මිය / ජේ. විජේසිංහ මයා (ඉන්ද්‍රාණි සුගතදාස මිය වෙනුවට විකල්ප සාමාජික)	√	√	√	√

ආරාධනයෙන් සහභාගි වීම

සභාපති, කළමනාකාර අධ්‍යක්ෂ, කළමනාකරු- මූල්‍ය සහ අභ්‍යන්තර විගණන නිලධාරී ආරාධනයෙන් රැස්වීම්වලට සහභාගි වූහ. ජාතික විගණන කාර්යාලය නියෝජනය කරමින් සහකාර විගණකාධිපති සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක නිලධාරීවරයා නිරීක්ෂකයන් ලෙස රැස්වීම්වලට සහභාගි වූහ.

වර්ෂය තුළ කමිටුවේ ක්‍රියාකාරකම්

- සමාගමේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පරීක්ෂා කරන ලදී.
- අභ්‍යන්තර විගණන වාර්තා අදාළ පාර්ශ්වයන්ගේ අනුරූපී ප්‍රතිචාර සමගින් සමාලෝචනය කරන ලදී.
- වර්ෂයට අදාළව ජාතික විගණන කාර්යාලය විසින් මතු කරන ලද විගණන විමසුම් සඳහා ඉදිරිපත් කිරීම පිණිස පිළියෙල කරන ලද පිළිතුරු සමාලෝචනය කරන ලදී.
- විනය ක්‍රියා මාර්ග, කර්මාන්තශාලා මෙහෙයුම් සහ තොරතුරු පද්ධතියට අදාළ වාර්තා සමාලෝචනය කර සාකච්ඡා කරන ලදී.
- ව්‍යාපාරික මෙහෙයුම් වැඩි දියුණු කිරීම පිණිස අවශ්‍ය අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග, අවශ්‍ය පාලන අභ්‍යන්තර පාලන අධීක්ෂණ යන්ත්‍රණ නිර්දේශ කරන ලදී.

කමිටුවේ යොමුකිරීම් අනුදේශ සියලු ප්‍රමාණාත්මක අංශවල විෂයයන් ආවරණය කරන ලද බව විගණන කමිටුව නිගමනය කරයි.

විගණන කමිටුව

විගණන කමිටු සාමාජිකයන්

- ජේ.වී.ටී.ඩී.එස්. කුමාර මිය: සභාපතිතුමිය - අධ්‍යක්ෂ, කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම / සහාය අධ්‍යක්ෂ,
- රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව
- ඩී.එම්.එම්. දිසානායක මිය: සාමාජික - අධ්‍යක්ෂ, කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම /ප්‍රධාන ගණකාධිකාරී,
- වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
- ජේ. විජේසිංහ මයා: සාමාජික - අධ්‍යක්ෂ, කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම

ජේ.වී.ටී ඩී.එස්. කුමාර
සභාපති - විගණන කමිටුව

ලාභ හෝ අලාභ පිළිබඳ ප්‍රකාශනය

වගුව 22

මාර්තු 31න් අවසන් වසර සඳහා	සටහන	2023 රු.	2022 රු.
ආදායම	03	2,635,413,672.26	1,041,133,241
විකුණුම් පිරිවැය	04	(2,285,165,802.89)	(1,026,129,751)
දළ ලාභය		**350,247,869.37**	15,003,490
වෙනත් මෙහෙයුම් ආදායම	05	60,406,356.64	20,003,552
මෙහෙයුම් වියදම්වලට පෙර ලාභය		**410,654,226.01**	35,007,042
පරිපාලන වියදම්	06	(72,369,962.37)	(36,911,494)
විකුණුම් සහ බෙදාහැරීම් වියදම්	07	(1,237,181.17)	(247,805)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලාභ		**337,047,082.47**	(2,152,257)
මූල්‍ය ආදායම්	08.1	19,694,964.91	8,475,019
මූල්‍ය වියදම්	08.2	(9,754,534.21)	(9,087,534)
ශුද්ධ මූල්‍ය ආදායම		9,940,430.70	(612,515)
බදුකරණයට පෙර ශුද්ධ ලාභය		**346,987,513.17**	(2,764,772)
බදුකරණය	09	(126,186,737.83)	(4,533,980)
බදුකරණයෙන් පසු ශුද්ධ ලාභය		**220,800,775.34**	(7,298,752)
කොටසක් සඳහා ඉපැයුම්	10.1	47.92	(1.58)

පිටු 73 සිට 105 දක්වා වූ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අත්‍යවශ්‍ය කොටසක් වන්නේය.

අනෙකුත් විස්තීරණ ආදායම් පිළිබඳ ප්‍රකාශනය

වගුව 23

මාර්තු 31න් අවසන් වසර සඳහා	සටහන	2023 රු.	2022 රු.
බදුකරණයෙන් පසු ශුද්ධ ලාභය		**220,800,775.34**	(7,298,752)
දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය		**32,052,653.94**	210,342,260
විශ්‍රාම ප්‍රතිලාභ මත ආයුගණක ලාභ/(අලාභ)		**725,235.00**	2,261,866
විලම්බිත බදු ලාභ/(අලාභ)		**(9,833,366.68)**	(316,661)
වසර සඳහා මුළු විස්තීරණ ආදායම		**243,745,297.60**	204,988,713

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

වගුව 24

මාර්තු 31 දිනට	සටහන	2023 රු.	2022 රු.
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත සහ උපකරණ	11	**455,278,831.58**	408,932,314
ජීව විද්‍යාත්මක වත්කම්	12	**9,496,407.44**	7,515,076
බීසීසී ලංකා සමාගමෙන් අයවිය යුතු මුදල්		**51,574,327.25**	61,118,342
ජංගම නොවන මුළු වත්කම්		**516,349,566.27**	477,565,732
ජංගම වත්කම්			
වට්ටෝරු භාණ්ඩ	**13**	**329,654,977.65**	174,032,240
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ	**14**	**84,256,245.09**	96,482,877
ලැබිය යුතු ආදායම් බදු	**24**	**-**	6,687,095
කෙටි කාලීන ආයෝජන	**15**	**106,603,103.50**	160,388,653
මුදල් හා මුදලට සමාන දෑ	**16**	**167,631,144.53**	6,064,539
මුළු ජංගම වත්කම්		**688,145,470.77**	443,655,403
මුළු වත්කම්		**1,204,495,037.04**	921,221,136
ස්කන්ධ හා බැරකම්			
ස්කන්ධ			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	**17**	**46,375,070.00**	46,375,070
ප්‍රදානය - මහා භාණ්ඩාගාරය	**18**	**16,881,850.00**	18,204,900
සංචිත	**18**	**821,703,707.45**	578,959,686
මුළු ස්කන්ධ		**884,960,627.45**	643,539,656
ජංගම නොවන බැරකම්			
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	**19**	**24,165,506.17**	23,837,759
විලම්බිත බදු බැරකම	**23**	**106,580,129.29**	44,910,997
ජංගම නොවන මුළු බැරකම්		**130,745,635.46**	68,748,757

ජංගම බැරකම්			
වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ	**20**	**114,449,763.73**	126,054,490
ණය හා ණය ගැනීම්	**21**	**-**	6,027,778
බැංකු අයිරා	**22**	**-**	76,850,455
ගෙවිය යුතු ආදායම් බදු	**24**	**74,339,010.40**	-
මුළු ජංගම බැරකම්		**188,788,774.13**	208,932,723
මුළු ස්කන්ධ හා බැරකම්		**1,204,495,037.04**	921,221,136

පිටු 73 සිට 105 දක්වා වූ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අත්‍යවශ්‍ය කොටසක් වන්නේය.

මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත්තේ 2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතා ප්‍රකාරව බව අපි සහතික කරමු.

.....
කළමනාකාර අධ්‍යක්ෂ

.....
මූල්‍ය කළමනාකරු

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිවයුතු වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලදී.

.....
සභාපති

.....
අධ්‍යක්ෂ

2023 සැප්තැම්බර් 27 වැනි දින.

ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය

වගුව 25

	ප්‍රකාශිත ප්‍රාග්ධනය රු.	මහා භාණ්ඩාගාරය රු.
2021 අප්‍රේල් 01 දිනට ශේෂය	**46,375,070.00**	**-**
ලියා හරින ලද - ගිරාගම වතුයායෙන් චල නොවන ශේෂය		
ලලාන් ඉංජිනියරින් උපචිත වියදම්		
වසර සඳහා ශුද්ධ ලාභය	-	-
වෙනත් විස්තීරණ ආදායම		
ප්‍රදානය - මහා භාණ්ඩාගාරය		18,204,900.00
2022 මාර්තු 31 දිනට ශේෂය	**46,375,070.00**	**18,204,900.00**
වසර සඳහා ශුද්ධ ලාභය	-	-
ලියා හරින ලද - 2017 වසරේ ISO වියදම		
2021/22 වසරේ ඉතිරිකිරීම් හිඟුම් පොළී ආදායම		
ආරම්භක තොග ගැලපුම		
වෙනත් විස්තීරණ ආදායම		
ප්‍රදානය ක්‍රමක්ෂය		(1,323,050.00)
2023 මාර්තු 31 දිනට ශේෂය	**46,375,070.00**	**16,881,850.00**

ප්‍රාග්ධන සංචිත රු.	රඳවාගත් ලාභය රු.	එකතුව රු.
600,000.00	**372,851,741.71**	**419,826,811.71**
		-
	(1,046,770.96)	**(1,046,770.96)**
		-
	1,566,001.92	**1,566,001.92**
		-
-	(7,298,751.88)	**(7,298,751.88)**
		-
	212,287,465.06	**212,287,465.06**
		-
		18,204,900.00
		-
600,000.00	**578,359,685.85**	**643,539,655.85**
-	220,800,775.34	**220,800,775.34**
		-
	(559,009.00)	**(559,009.00)**
		-
	500,725.00	**500,725.00**
		-
	(942,992.00)	**(942,992.00)**
		-
	22,944,522.26	**22,944,522.26**
		-
		(1,323,050.00)
		-
		-
600,000.00	**821,103,707.44**	**884,960,627.44**

පිටු 73 සිට 105 දක්වා වූ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අත්‍යවශ්‍ය කොටසක් වන්නේය.

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

වගුව 26

මාර්තු 31න් අවසන් වසර සඳහා	සටහන	2023 රු.	2022 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල්			
බදුකරණයට පෙර ශුද්ධ ලාභය/(අලාභය)		**346,987,513**	(2,764,772)
ගැලපීම්:			
ලියා හරින ලද ගෙවිය යුතු දෑ		**(3,749,122)**	1,566,001
ලියා හරින ලද ලැබිය යුතු දෑ		**-**	(1,046,771)
ක්ෂයවීම		**49,632,166**	28,499,468
විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය සඳහා ප්‍රතිපාදනය		**5,866,198**	4,503,132
ලියා හළ ආර්ථික සේවා ගාස්තු		**6,687,095**	-
පොලී ආදායම		**(19,694,965)**	(8,475,019)
ජීවවිද්‍යාත්මක වත්කම් ක්ෂය වීම		**213,238**	104,845
බොල් හා අඩමාන ණය		**2,159,572**	121,236
පොලී වියදම්		**9,754,534**	9,087,534
රජයේ ප්‍රදානය ක්‍රමක්ෂය		**(1,323,050)**	-
පෙර වසරේ ගැලපුම		**(1,001,276)**	
කාරක ප්‍රාග්ධන විචලනයට පෙර මෙහෙයුම් ලාභය/(පාඩුව)		**395,531,904**	31,595,655
භාණ්ඩ ලේඛන (වැඩිවීම) / අඩුවීම		**(155,622,737)**	(24,975,524)
බීසීසී ලංකා සමාගමෙන් ලැබිය යුතු දෑ (වැඩිවීම)/ අඩුවීම		**9,544,015**	(36,630,006)
වෙළඳ සහ අනෙකුත් අයවිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම		**23,411,458**	
වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු වැඩිවීම/ (අඩුවීම)		**(7,855,604)**	42,555,443
මෙහෙයුම්වලින්/ (භාවිත කරනු ලැබූ) උත්පාදිත මුදල්		**265,009,035**	12,545,567
ගෙවන ලද පාරිතෝෂික		**(4,813,216)**	(2,046,568)
ගෙවන ලද බදු		**(11,962)**	-
ගෙවන ලද පොලී		**(9,754,534)**	(9,087,534)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ ලාභය/ (භාවිත කළ)		**250,429,322**	1,411,465
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ			
දේපළ, පිරියත හා උපකරණ අත්කර ගැනීම		**(15,756,697)**	(22,396,577)
නොනිමි ප්‍රාග්ධන වැඩ මත ආයෝජනය		**1,830,667**	(1,577,957)
ජීව විද්‍යාත්මක වත්කම් අත්කර ගැනීම		**(2,194,569)**	(1,521,473)
ලැබුණු පොලිය		**6,350,566**	5,739,106
මූල්‍ය වත්කම්වල ශුද්ධ වෙනස්කම්		**3,785,549**	(672,678)
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල්/(භාවිත කළ)		**(5,984,483)**	(20,429,578)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල්/(භාවිත කළ)			
ණය හා ණය ගැනීම් ආපසු ගෙවීම		**(6,027,778)**	(16,933,333)
මහා භාණ්ඩාගාරය වෙත ප්‍රදානය		**-**	18,204,900
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ /(භාවිත කළ)		**(6,027,778)**	1,271,567
මුදල් හා මුදලට සමාන දේවල ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)		**238,417,061**	(17,746,546)
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදලට සමාන දේ		**(70,785,917)**	(53,039,371)
වසර අවසානයේදී මුදල් සහ මුදලට සමාන දේ	**16**	**167,631,144**	(70,785,917)

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් වාර්තාකරණ අස්තිත්වය

1.1 සංස්ථාමය තොරතුරු

සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ 1992 සැප්තැම්බර් 30 දින සංස්ථාගත කරන ලද සහ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 2009 ජුනි 16 වන දින යළි ලියාපදිංචි කරන ලද ඇපයෙන් සීමිත වූ, ශ්‍රී ලංකාව නිත්‍ය වාසස්ථානය වන සමාගමකි.

සමාගමේ ලියාපදිංචි කාර්යාලය අංක 53, රත්නායක මාවත, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයෙහි පිහිටා තිබේ.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම වනුයේ තේ වගා කිරීම සහ නිෂ්පාදනය සහ තේ වගාකරුවන්ගෙන් සහ තමන්ටම අයත් වතුයායන්ගෙන් මිලදී ගත් තේ අලෙවි කිරීමයි.

1.3 අධ්‍යක්ෂවරු

2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය මේ සමග ඉදිරිපත් කරයි. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වග කිව යුතු වේ.

2023 මාර්තු 31 දිනට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වූයේ,

- ඩී.කේ.යූ. අමින්ද රොද්‍රිගෝ මයා - (සභාපති)
- ජේ.ඒ.ටී.ඩී.එස්. කුමාර මිය
- ඩී.එම්.එම්. දිසානායක මිය
- දොන් උපුල් අබේසුන්දර මයා
- ඩබ්.කේ.බී.ටී.කේ. අල්විස් මයා
- ජයන්ත විජේසිංහ මයා
- ආර්.සී.ඩී. ජයවර්ධන මයා
- එස්.ඒ.බී. හේරත් මයා

1.4 සමාගමේ ලේකම්වරු

ආර්එන්එච් හෝල්ඩිංග්ස් (පුද්ගලික) සමාගම
ආර්එන්එච් මන්දිරය, අංක 622 බී,
කෝට්ටේ පාර, කෝට්ටේ.

1.5 ලියාපදිංචි කාර්යාලය

අංක. 53, රත්නායක මාවත, පැලවත්ත, බත්තරමුල්ල.

1.6 විගණකවරු

විගණකාධිපති,
ජාතික විගණන කාර්යාලය,
අංක 306/72,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

1.7 මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට බලය පැවරූ දිනය

2023 මාර්තු 31න් අවසන් වර්ෂය සඳහා කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා 2023 සැප්තැම්බර් මස 20 වැනි දින අධ්‍යක්ෂවරුන් විසින් බලය පවරන ලදී.

පොදු ප්‍රතිපත්ති

2.1 පිළියෙල කිරීමේ පදනම

කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ මූල්‍ය ප්‍රකාශන මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, විස්තීරණ ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, සහ ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වලින් සමන්විත වේ. මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් පනවා ඇති ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (LKAS and SLFRS) අනුකූලව පිළියෙල කර ඇත.

2.2 මැනීමේ පදනම

අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකමට අදාළව යෝග්‍ය හෙළිදරව් කිරීම් සිදු කර ඇති අවස්ථාවන්හි හැර මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇත්තේ ඓතිහාසික පිරිවැය පදනමිනි. වත්කම් සහ බැරකම් ඒවායේ සාපේක්ෂ ද්‍රවශීලතාව නිරූපණය කරන පරිදි ස්වභාවය අනුව කාණ්ඩගත කර තිබේ.

මූල්‍ය ප්‍රකාශනයන්හි හඳුනාගෙන ඇති ප්‍රමාණ මත වඩාත්ම සැලකිය යුතු බලපෑමක් ඇති කරන ගිණුම්කරණ ප්‍රතිපත්ති ආදේශ කිරීමේදී වැදගත් ඇස්තමේන්තු ක්ෂේත්‍ර, අවිනිශ්චිතතාව සහ තීරණාත්මක තීන්දු පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන්වල ඇතුළත් කර තිබේ.

2.3 බදුකරණය

(a) ජංගම බදු

මූල්‍ය ප්‍රකාශවල වාර්තා කර ඇති පරිදි ආදායම් බදු සඳහා ප්‍රතිපාදන පදනම්ව ඇත්තේ ආදායම් සහ වියදම් මූලිකාංග මත වන අතර 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ සහ එහි පසු සංශෝධනයන්හි විධිවිධාන ප්‍රකාරව ගණනය කර ඇත.

(b) විලම්බිත බදු

බැරකම් ක්‍රමවේදය යොදා ගනිමින් විලම්බිත බදු සපයනු ලැබ ඇත්තේ මූල්‍ය වාර්තාකරණ කාර්යය සහ බදු කාර්යය සඳහා භාවිත කරනු ලැබූ මුදල් ප්‍රමාණ සඳහා වත්කම් සහ බැරකම්වල ධාරණ අගයන් තාවකාලික වෙනස්කම් සඳහා විධිවිධාන සලස්වමිනි. විලම්බිත බදු මනිනු ලබන්නේ වාර්තාකරණ දිනය වන විට පනවා ඇති නීති මත පදනම්ව, තාවකාලික වෙනස්කම් ප්‍රත්‍යාවර්තනය කළ විට ඒවාට ආදේශ කිරීමට අපේක්ෂා කරනු ලබන බදු අනුපාතයටය.

විලම්බිත බදු වත්කම් පිළිගනු ලබනුයේ එම කාල අන්තරවලට සාපේක්ෂව ප්‍රයෝජනයට ගනු ලැබිය හැකි අනාගත බදු අය කළ හැකි ලාභ පැවතීමේ සම්භාවිතාවක් ඇති ප්‍රමාණයටය. විලම්බිත බදු වත්කම් එක් එක් වාර්තාකරණ දිනයට සමාලෝචනය කරනු ලබන අතර ආශ්‍රිත බදු ප්‍රතිලාභ සාක්ෂාත් කර ගැනීමේ ඉඩක් තවදුරටත් නොමැතිවීමේ ප්‍රමාණයට අඩු කරනු ලැබේ.

2.4. වත්කම් තක්සේරුව සහ ඒවායේ මැනීමේ පදනම

2.4.1 දේපළ, පිරියත හා උපකරණ

දේපළ, පිරියත හා උපකරණ ප්‍රකාශ කරනු ලබන්නේ සමුච්චිත ක්ෂයවීම් සහ වටිනාකමේ කිසියම් හානියක් වේ නම් එය අඩු කර පිරිවැයට හෝ සාධාරණ අගයටය. සිදුවීම් හෝ තත්ත්වයන් වෙනස්වීම් මගින් ධාරණ අගය යළි අය කර ගත නොහැකි බව පෙන්නුම් කරන අවස්ථාවන්හිදී දේපළ, පිරියත හා උපකරණවල ධාරණ අගයේ හානිවීම් සඳහා සමාලෝචනය කරනු ලැබේ. සියලු දේපළ, පිරියත හා උපකරණ අයිතම මුලින්ම වාර්තා කර ඇත්තේ පිරිවැයටය. දේපළ, පිරියත හා උපකරණ පසු ප්‍රත්‍යාගණනය කර ඇති විටදී, එබඳු වත්කම්වල සමස්ත කාණ්ඩයම සාධාරණ අගයන්ට ප්‍රත්‍යාගණනය කරනු ලැබේ. මෙම ප්‍රත්‍යාගණනය කිරීම් ප්‍රමාණවත් නිත්‍යතාවකින් සිදු කරනු ලැබේ. වත්කමක් ප්‍රත්‍යාගණනය කළ විට ධාරණ අගයේ කිසියම් වැඩිවීමක්, පෙර විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගෙන ඇති එම වත්කමේම ප්‍රත්‍යාගණන අඩුවීමක් එය ප්‍රතිවර්තනය කරන්නා වූ අවස්ථාවක හැර එය ප්‍රත්‍යාගණන සංචිතයට සෘජුවම බැර කරනු ලැබේ. එකම වත්කමෙහි පෙර අතිරික්තයක් හිලව් කරන්නා වූ යම් ප්‍රත්‍යාගණන හිඟයක්, ප්‍රත්‍යාගණන සංචිතයේ අතිරික්තයට සෘජුව හිලව් කරන අතර යම් අතිරික්තයක් වේ නම් එය විදයදමක් ලෙස පිළිගනු ලැබේ.

බැහැර කිරීමේදී විකුණනු ලැබූ වත්කමට අදාළ කිසියම් ප්‍රත්‍යාගණන සංචිතයක් වේ නම් එය රඳවාගත් ඉපැයුම්වලට පවරනු ලැබේ. යම් දේපළ, පිරියත හෝ උපකරණ අයිතම ප්‍රතිස්ථාපනය කිරීමේදී හෝ බැහැර කිරීමේදී හෝ ඒවායේ භාවිතය මගින් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන්නේ නම් ඒවා ඉවත් කරනු ලැබූ සේ සැලකේ. එසේ වත්කම් ඉවත් කිරීම හේතුවෙන් ඇතිවන කිසියම් ලාභයක් හෝ පාඩුවක් එලෙස ඉවත් කිරීම සිදු කළ වර්ෂයේ ආදායම් ප්‍රකාශනයට ඇතුළු කරනු ලැබේ.

(අ) ක්ෂයවීම

පිරිවැය මත සරල රේඛීය ක්‍රමය භාවිත කිරීම මගින් හෝ සින්නක්කර ඉඩම් හැර අනෙකුත් සියලු දේපළ, පිරියත සහ උපකරණ තක්සේරු කිරීම මගින් එම වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය තුළ එම ප්‍රමාණ පොත්වලින් ඉවත් කිරීම පිණිස, ක්ෂයවීම් සඳහා වූ ප්‍රතිපාදන ගණනය කරනු ලබයි. වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය පහත දැක්වෙන පරිදි වේ.

වත්කම් කාණ්ඩය	අවුරුදු
ගොඩනැගිලි	20
ජලය සහ විදුලිය	20
රථ වාහන	4
පිරියත හා යන්ත්‍රෝපකරණ	8
උපකරණ	8
ලී බඩු සහ සවිකුරු	8
පරිගණක උපකරණ	8
මාර්ග	10
වෙනත්	8
ජීව විද්‍යාත්මක වත්කම් (තේ)	30

සින්නක්කර ඉඩම් සඳහා අසීමිත ආයු කාලයක් ඇතැයි සලකන බැවින් ඒවා ක්ෂය කරනු නොලැබේ.

සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය සහ අවශිෂ්ට වටිනාකම සමාලෝචනය කර අවශ්‍ය නම් ගලපනු ලැබේ.

(ආ) ප්‍රතිසංස්කරණ පිරිවැය

මුලින්ම තක්සේරු කළ කාර්යසාධන ප්‍රමිතියෙන් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ ප්‍රකෘතිමත් කිරීම හෝ පවත්වාගෙන යාම පිණිස දේපළ. පිරියත හා උපකරණ අලුත්වැඩියාව හෝ නඩත්තුව සඳහා දැරෑ වැය, එලෙස දැරෑ විටදී වියදමක් ලෙස පිළිගනු ලැබේ.

2.4.2 ජීව විද්‍යාත්මක වත්කම්

සමාගම ජීව විද්‍යාත්මක වත්කම් හඳුනාගනු ලබන්නේ පිරිවැය පදනමෙනි. සමාගමේ ජීව විද්‍යාත්මත වත්කම් කළුබෝවිටියාන සහ දෑරංගල කර්මාන්තශාලාවල ඇති තේ පඳුරුවලින් සමන්විත වේ. සමාගම පැළ අවුරුදු 3 දක්වා නොමේරූ ලෙස ද අවුරුදු 3ට වඩා වැඩි පඳුරු මේරූ ලෙස ද පිළිගනියි.

2.4.3 මූල්‍ය වත්කම් (ව්‍යුත්පන්න නොවන)

සමාගම සතුව පහත දැක්වෙන මූල්‍ය වත්කම් තිබේ (ව්‍යුත්පන්න නොවන):

- ණය හා ලැබිය යුතු දේ
- මුදල් හා මුදලට සමාන දේ

(අ) ණය හා ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ යනු සක්‍රිය වෙළඳපොළක මිල ගණන් ඉදිරිපත් කර නොමැති ස්ථාවර සහ නිශ්චයනීය ගෙවීම් සහිත මූල්‍ය වත්කම් වේ. එබඳු වත්කම් මුලින්ම සාධාරණ අගය සහ සෘජුව ආරෝපණය කළ හැකි කිසියම් ගනුදෙනු පිරිවැයකට පිළිගනු ලැබේ. මූලික පිළිගැනීමට තදනන්තරව, ණය හා ලැබිය යුතු දෑ ගණනය කරනු ලබන්නේ යම් හානිකරණ අලාභ අඩුකොට සඵල පොලී ක්‍රමවේදය භාවිත කරමින් ක්‍රමක්ෂිත පිරිවැයටය. ණය සහ ලැබිය යුතු දෑ වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෙයින් සමන්විත වේ.

(ආ) මුදල් හා මුදල් සමාන දෑ

මුදල් ප්‍රවාහ පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශයන්හි, මුදල් හා මුදලට සමාන දෑ මුදල් ශේෂ හා මාස තුනක් හෝ ඊට අඩු මූලික කල්පිරීමක් සහිත ඒක්ෂණ තැන්පතුවලින් සමන්විත වේ. ඉල්ලුම මත ආපසු ගෙවිය හැකි සහ සමාගමේ මුදල් කළමනාකරණයේ අනුකලන කොටසක් වන්නාවූ බැංකු අයිරා මුදල් හා මුදලට සමාන දේවල සංරචකයක් ලෙස මුදල් ප්‍රවාහයන්හි කාර්යය සඳහා අන්තර්ගත කොට ඇත. මුදල් හා මුදලට සමාන දෑ අතැති මුදල් හා බැංකුවේ තැන්පතුවලින් සමන්විත වේ. වක්‍ර ක්‍රමවේදය භාවිත කරමින් සකස් කොට ඇති මුදල් ප්‍රවාහයන්හි කාර්යය සඳහා මුදල් හා මුදලට සමාන දෑ සංරචකයක් ලෙස බැංකු අයිරා අන්තර්ගත කොට ඇත.

2.4.4 හානිකරණය

ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයක් දරනු නොලබන මූල්‍ය වත්කමක්, එය හානිවූ බවට වාස්තවික සාක්ෂි තිබේදැයි නිර්ණය කිරීම සඳහා එක් එක් වාර්තාකරණ දිනයට තක්සේරු කරනු ඇත.

වත්කමේ මූලික පිළිගැනීමෙන් පසු අලාභ සිදුවීමක් සිදුව ඇති බවට වාස්තවික සාක්ෂි මගින් පෙන්නුම් කරන්නේ නම් සහ විශ්වසනීය ලෙස මිනිය හැකි එම වත්කමේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්ට නිශේධනීය බලපෑමක් එම අලාභ සිදුවීම ඇති කළේ නම් මූල්‍ය වත්කමක් හානිවී ඇත.

ලැබිය හැකි දේ සඳහා හානි පිළිබඳ සාක්ෂි සමාගම සාමූහික මට්ටමේදී සලකා බලයි. සමාන අවදානම් ගතිලක්ෂණ සහිත ලැබිය හැකි සියලු දේ එකට කාණ්ඩ කරන අතර සිදුව ඇති, එහෙත් මෙතෙක් හඳුනාගෙන නොමැති කිසියම් හානියක් සඳහා සාමූහිකව තක්සේරු කරනු ඇත.

ක්‍රමක්ෂිත පිරිවැයට මනිනු ලබන මූල්‍ය වත්කමකට අදාළ හානි අලාභයක් එහි ධාරණ වටිනාකම හා වත්කමේ මුල් සඵල පොලී අනුපාතයට වට්ටම් කරනු ලැබූ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි වත්මන් වටිනාකම අතර වෙනස ලෙස ගණනය කරනු ලැබේ. අලාභවීම් ලාභ හෝ පාඩුවල පිළිගනු ලබන අතර ලැබීම්වලට සාපේක්ෂව දීමනා ගිණුමක පෙන්නුම් කරනු ලැබේ. හානි වූ වත්කමක් මත පොලිය, වට්ටම අනාගතයට ගැලපීම හරහා අඛණ්ඩව පිළිගනු ලැබේ. පසුව ඇති වන සිදුවීමක් හානි අලාභ වටිනාකම අඩු කිරීමට හේතු වන්නේ නම්, ලාභ හෝ පාඩු හරහා හානි අලාභයේ අඩුවීම ප්‍රතිවර්තනය කරනු ලැබේ.

2.4.5 වට්ටෝරුගත භාණ්ඩ

වට්ටෝරුගත භාණ්ඩ සකසන ලද, නොසකසන ලද හා අර්ධ වශයෙන් සකසන ලද කෘෂිකාර්මික නිෂ්පාදන සහ අනෙකුත් පාරිභෝජ්‍ය ද්‍රව්‍යවලින් සමන්විත වේ. සකසන ලද, නොසකසන ලද හා අර්ධ වශයෙන් සකසන ලද කෘෂිකාර්මික නිෂ්පාදන මූල්‍ය කාල සීමාව අවසානයේදී පූර්ණව සකසන ලද කෘෂිකාර්මින නිෂ්පාදන සේ සලකනු ලබන අතර ශුද්ධ උපලබ්ධි කළ හැකි අගයට තක්සේරු කරනු ලැබේ.

අනෙකුත් පාරිභෝජ්‍ය ද්‍රව්‍ය තක්සේරු කර ඇත්තේ වඩා අඩු පිරිවැයට සහ උපලබ්ධි කළ අගයටය. වට්ටෝරු භාණ්ඩ විකිණීමේදී, එම වට්ටෝරු භාණ්ඩවල ධාරණ මුදල අදාළ ආදායම පිළිගනු ලැබූ කාල සීමාවේ වියදමක් ලෙස සමාගම පිළිගනු ලබයි.

2.5 බැරකම් හා ප්‍රතිපාදන

අතීත සිදුවීමකින් මතුවන වත්මන් බැඳීමක් පියවීමේදී ආර්ථික ප්‍රතිලාභ මූර්තිමත් කරමින් සම්පත් ගලා යාමක් එහි ප්‍රතිඵලය වේ යැයි අපේක්ෂා කරනු ලබන විටදී මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ බැරකම් පිළිගනු ලැබේ. ණයකරු ඉල්ලා සිටි විටදී හෝ වාර්තාකරණ දිනයේ සිට වසරක් තුළ ගෙවිය යුතු බැඳීම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම බැරකම් ලෙස සලකනු ලැබේ. මූල්‍ය තත්ත්වය දිනයේ සිට එක් වසරකට පසුව ගෙවිය යුතු බැරකම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් සේ සලකනු ලැබේ.

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස නෛතික හෝ සම්මුතික බැඳීමක් සමාගම සතු වන විටදී සහ එම බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමේ හැකියාවක් ඇති හා ඒ සඳහා විශ්වාසය තැබිය හැකි ඇස්තමේන්තුවක් සෑදිය හැකිවීම අවශ්‍ය කරනු ලබන විටකදී මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ප්‍රතිපාදනයක් පිළිගනු ලැබේ.

2.5.1 විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම්

(අ) නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිකය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 'ආයුගණක තක්සේරුව අනුව විශ්‍රාම ප්‍රතිලාභී අනුකූලව සේවා නියුක්තියේ පළමු වසරේ සිට විශ්‍රාම ප්‍රතිලාභ වෙනුවෙන් පූර්ණ ප්‍රතිපාදනයක් සලසා ඇත.

විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් නිර්ණය කිරීමේදී භාවිත කරනු ලබන වැදගත් උපකල්පනයන්ට පහත දැ ඇතුළත් වේ.

ආබාධිත බව: මර්ත්‍යතා වගුවෙන් 10%

කාර්ය මණ්ඩල පිරිවැටුම් අනුපාත: වයස අවුරුදු 54 දක්වා සියලු දෙනාට 1.00% සහ ඉන් අනතුරුව ශූන්‍ය වේ.

සාමාන්‍ය විශ්‍රාම ගැනීමේ වයස: අවුරුදු 60 (නිශ්චිත විශ්‍රාම වයසට වඩා වැඩි සේවකයන් ඔවුන්ගේ ඊළඟ උපන් දිනයට විශ්‍රාම යන්නා සේ උපකල්පනය කරනු ලැබේ.)

වට්ටම් අනුපාතය: වාර්ෂිකව 18.00%

වැටුප් උද්ගමන අනුපාත: මූලික වැටුප: කාර්ය මණ්ඩලය වසරකට 13.00%. දත්තවල නිශ්චිතව දක්වා ඇති මාසයට සෑම වසරකම වැටුප් වර්ධක ලැබීමට නියමිතය.

මූලික වැටුප: දෛනික වැටුප්ලාභී සේවකයන්: වසරකට 13.00%, මීළඟ වැටුප් වර්ධකය 2021 අප්‍රේල් මස ලැබීමට නියමිතය.

දීමනා: අදාළ නොවේ.

විශ්‍රාම පාරිතෝෂික සූත්‍රය: කාර්ය මණ්ඩලය: යටත් පිරිසෙයින් 5 වසරක සේවා කාලයක් ඇති අය සඳහා සේවයේ සම්පූර්ණ කළ සෑම වසරක් සඳහාම මාස භාගයක වැටුප

දෛනික වැටුප්ලාභී සේවකයන්: යටත් පිරිසෙයින් 5 වසරක සේවා කාලයක් ඇති අය සඳහා සේවයේ සම්පූර්ණ කළ සෑම වසරක් සඳහාම දින 14ක වැටුප

(ආ) සැලසුම්ගත දායකත්ව සැලැස්ම - සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල අදාල ප්‍රඥප්ති සහ නියමයන් ප්‍රකාරව සේවකයෝ සේවක අර්ථසාධක අරමුදල් දායක මුදල් සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ දායක මුදල්වලට සුදුසුකම් ලබති.

2.6 විස්තීරණ ආදායම් ප්‍රකාශනය

2.6.1 ආදායම හඳුනාගැනීම

ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ගලා ඒමට ඉඩ ඇති සහ දරන ලද හෝ දැරීමට නියමිත ආදායම සහ ආශ්‍රිත පිරිවැය විශ්වසනීය ලෙස මැනිය හැකි ප්‍රමාණයට ආදායම හඳුනාගනු ලැබේ. ලැබුණු ප්‍රතිශ්ධාව හෝ විකුණුම් වට්ටම හෝ විකුණුම් බදු නොමැතිව ලැබිය යුතු දේවල සාධාරණ වටිනාකමට ආදායම ගණනය කරනු ලැබේ.

භාණ්ඩ විකුණුම

හිමිකාරිත්වය හා සාමාන්‍යයෙන් සබැඳුණු ප්‍රමාණයට අඛණ්ඩ කළමනාකාරිත්ව මැදිහත්වීමක් හෝ විකුණන ලද භාණ්ඩ පිළිබඳ සඵල පාලනයක් සමාගම විසින් රඳවා නොගන්නා විට හා භාණ්ඩවල හිමිකාරිත්වයේ සැලකිය යුතු අවදානම් සහ පරිදාන ගැනුම්කරුට පවරා ඇති විටදී භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම පිළිගනු ලැබේ.

ලාභ හා අලාභ

දේපළ, පිරියත උපකරණ හා ආයෝජන ඇතුළුව වෙනත් ජංගම නොවන වත්කම් අපහරණය කිරීමේදී පැන නගින ආදායම් ස්වභාවයේ ශුද්ධ ලාභ අලාභ ඒ සඳහා අපරහණය මත ලැබෙන මුදල්වලින්, එවන් වත්කම්හි ධාරණ මුදල හා ආශ්‍රිත විකුණුම් වියදම්වලින් අඩු කිරීමෙන් පසු ආදායම් ප්‍රකාශයේ ගණන් දක්වා ඇත. ප්‍රධාන ආදායම් උත්පාදන ක්‍රියාකාරකම්වලට ආනුෂංගික ක්‍රියාකාරම්වලින් පැන නගින හා ද්‍රව්‍යමය නොවන සමාන ගනුදෙනු කාණ්ඩයකින් පැන නගින ලාභ හා අලාභ ශුද්ධ පදනමකින් එකතු කොට, වාර්තා කොට ඉදිරිපත් කරනු ලැබේ.

සහතික කරන ලද කුලී මුදල්වලින් මතුවන කිසියම් අලාභයක් එම අලාභය සිදු වූ වසරේදීම ගිණුම්වල දක්වනු ලැබේ. හොඳම ඇස්තමේන්තුව අලාභයක් පෙන්නුම් කරන්නේ නම් ප්‍රතිපාදනයක් පිළිගනු ලැබේ.

පොලී ආදායම

සඵල පොලී ක්‍රමවේදය භාවිත කරමින් උපචිත පදනමකින් පොලී ආදායම පිළිගනු ලැබේ.

වෙනත් ආදායම

සඵල පොලී ක්‍රමවේදය භාවිත කරමින් අනිකුත් ආදායම් උපචිත පදනමකින් පිළිගනු ලැබේ.

2.6.2 වියදම් හඳුනාගැනීම

